# කාර්ය සාධන වාර්තාව - 2018


**සමාජ සේවා දෙපාර්තමේන්තුව**
**දෙවන මහල**
**සෙත්සිරිපාය - II අදියර**
**බත්තරමුල්ල**

| | |
|---|---|
| දුරකථන | - 0112187050 |
| ෆැක්ස් | - 0112186276 |
| ඊ - මේල් | - dirss@sltnet.lk |
| | - dirssdss@gmail.com |
| වෙබ් අඩවිය | - www.socialservices.gov.lk |

# පටුන


| | | පිටුව |
|---|---|---|
| | හැඳින්වීම - සමාජ සේවා අධ්‍යක්ෂගේ පණිවුඩය | |
| | සමාජ සේවා දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර හා ඉලක්ක කණ්ඩායම් | |
| | කාර්ය මණ්ඩලය හා සංවිධාන ව්‍යුහය | |
| | 1 වන පරිච්ඡේදය - මූල්‍ය ප්‍රගතිය | |
| | 2 වන පරිච්ඡේදය - ආබාධ සහිත පුද්ගලයන් සඳහා වන සුභසාධන වැඩසටහන | |
| | • ආබාධ සහිත තරුණ තරුණියන් පුනරුත්ථාපනය කිරීම, වෘත්තීය පුහුණුව ලබාදීම හා සමාජගත කිරීම | |
| | • ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානයේ - ළමා මාර්ගෝපදේශන වැඩසටහන | |
| | • ජාතික ප්‍රජා මූලික පුනරුත්ථාපන වැඩසටහන | |
| | • දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල | |
| | • ආබාධ සහිත දරුදැරියන්ගේ ක්‍රීඩා හා කලා කුසලතා සංවර්ධන වැඩසටහන | |
| | 3 වන පරිච්ඡේදය - මතට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කිරීම හා සමාජගත කිරීම | |
| | 4 වන පරිච්ඡේදය - නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන්, පුහුණු පාඨමාලා, වැඩමුළු හා සම්මන්ත්‍රණ පැවැත්වීම | |

## සමාජ සේවා අධ්‍යක්ෂගේ පණිවුඩය

ශ්‍රීමත් අයිවර් ජෙනිංග්ස් මහතාගේ මූලිකත්වයෙන් 1944 වර්ෂයේ පත්කරන ලද සමාජ සේවා පිළිබඳ කොමිෂන් සභාවේ නිර්දේශ මත 1948 පෙබරවාරි 01 වන දින සමාජ සේවා දෙපාර්තමේන්තුව ස්ථාපනය කරන ලද අතර වර්තමානයේ සමාජ සේවා විෂය භාර අමාත්‍යාංශය යටතේ දෙපාර්තමේන්තු කාර්යභාරය ඉටු කරනු ලබයි.

දෙපාර්තමේන්තු මෙහෙයට අනුගත වෙමින් 2018 වර්ෂයට ලැබී ඇති ප්‍රතිපාදනවලට අනුකූලව හඳුනාගත් විවිධ වැඩසටහන් සැලසුම් සහගතව බිම් මට්ටමේ සිට ජාතික තලය දක්වා ක්‍රියාත්මක කොට ඇත. විශේෂයෙන් ආබාධ සහිත තරුණ ප්‍රජාව ඉලක්ක කරගනිමින් ක්‍රියාත්මක කරන ලද සුභසාධන වැඩසටහන් තුළ සාර්ථක ප්‍රගතියක් අත්කර ගැනීමට දෙපාර්තමේන්තුවට හැකියාව ලැබී ඇත. ආබාධ සහිත තරුණ තරුණියන් සඳහා වෘත්තීය පුහුණුව ලබා දීම හා ඔවුන් සමාජගත කිරීම තුළින් ඔවුන්ගේ ජීවනෝපාය මාර්ග සංවර්ධනය සඳහා ඉහළ දායකත්වයක් ලබා දීමට මෙම වර්ෂයේ හැකි විය.

ආබාධිත ප්‍රජාව සඳහා ක්‍රියාත්මක කරන ලද ප්‍රජා මූලික පුනරුත්ථාපන වැඩසටහන (CBR)හි 96.06% ක ප්‍රගතියක් අත්කර ගැනීමට 2018 වර්ෂයේ හැකිවිය. විධිමත් ක්‍රමවේදයන් අනුව සැලසුම් සහගතව දිස්ත්‍රික් හා කොට්ඨාශ මට්ටමින් ආබාධිත ප්‍රජාව සඳහා අවශ්‍ය සේවා ලබාදීමට මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ. මෙම වැඩසටහනේ නව අංගයක් ලෙස ක්‍රියාත්මක වන රෝහල් පද්ධතිය සම්බන්ධ ආබාධිත ප්‍රජාව සඳහා කරන ලද වැඩසටහන් තුළ සාර්ථක ප්‍රගතියක් අත්කරගෙන ඇති බව විශේෂයෙන් සඳහන් කළ යුතුය. එසේම වෙනත් රාජ්‍ය ආයතනවලට සහය සේවා සැපයීම ඇතුළු විශාල වැඩ කොටසක් බිම් මට්ටමේ සිටින සියලුම ක්ෂේත්‍ර නිලධාරීන් විසින් ඉටුකරන ලද බව අභිමානයෙන් යුතුව මෙහිදී සඳහන් කළ යුතුය.

ආබාධ සහිත ප්‍රජාව සඳහා 2018 වර්ෂයේ සැලසුම් කරන ලද සියලුම ජාතික මට්ටමේ වැඩසටහන් ඉතා සර්ථකව පැවැත්වීමට හැකිවිය. මෙම වැඩසටහන් තුළින් අභ්‍යාසලාභීන් හා ඔවුන්ගේ දෙමාපියන්, කාර්ය මණ්ඩලය හා සෙසු සාමාජිකයින් අතර අන්‍යෝන්‍ය සුහදතාව, අවබෝධය හා විශ්වාසනීයත්වය වර්ධනය කිරීම අපේක්ෂා කෙරේ. විශේෂයෙන්ම උතුරු නැගෙනහිර ආබාධිත තරුණ තරුණියන්ගේ සුභසාධනය සඳහා කිලිනොච්චියේ සහ මඩකලපුවේ ඉදිකෙරෙන නව වෘත්තීය පුහුණු මධ්‍යස්ථානවල ඉදිකිරීම් කටයුතු අවසන් අදියර වෙත ළඟා වී ඇත.

මුල් ළමාවියේදීම ළමුන්ට ඇතිවන කායික හා මානසික ගැටළු අවම කිරීම සඳහා කල් ඇතිව මැදිහත්වී අවශ්‍ය සේවා පහසුකම් සැපයීමට කොළඹ කේන්ද්‍රීය කරගත් ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය මහරගම නාවින්න ප්‍රදේශයේ පිහිටුවා ඇත. එම මධ්‍යස්ථානය තුළ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් තුළ සැලකිය යුතු ප්‍රගතියක් අත්කරගැනීමට මෙම වර්ෂයේ දී හැකිවිය. මෙම වැඩසටහන මඟින් සැපයෙන සේවා පුළුල් කිරීම සඳහා කොළඹ දිස්ත්‍රික්කයේ කොට්ටාව නගරයේ ඉදිකරමින් පවතින ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථාන ගොඩනැගිල්ලෙහි වැඩ කටයුතු ද අවසන් අදියරට ළඟා වී ඇත. දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක කොට ඇති ප්‍රධානතම වැඩසටහනකි, මතට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කිරීම. ඒ යටතේ මතට ඇබ්බැහි වූවන් නේවාසිකව පුනරුත්ථාපනය කිරීම හා ඔවුන් සමාජගත කිරීමත් හා ප්‍රාදේශීය මට්ටමින් ජනතාව

දැනුවත් කිරීමේ මත් නිවාරණ වැඩසටහන් සාර්ථකව ක්‍රියාත්මක කිරිමට මෙම වර්ෂය තුළ දී හැකියාව ලැබිණි. එසේම දෙපාර්තමේන්තුව යටතේ සේවා සපයන නිලධාරීන්ගේ කාර්යක්ෂමතාව, සේවා අභිප්‍රේරණය හා ඵලදායීතාව වර්ධනය කිරීම සඳහා දේශීය හා විදේශීය වැඩමුළු, සම්මන්ත්‍රණ හා පුහුණු පාඨමාලා සඳහා යොමු කිරීම සිදුකොට ඇත.

සමස්තයක් වශයෙන් ගත් කල 2018 වසර තුළදී අවාසි සහගත හා පීඩාවන්ට පත් ප්‍රජාව සඳහා ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් තුළ 93.77% ප්‍රගතියක් අත්කර ගැනීමට හැකි වූ බව විශේෂයෙන් සඳහන් කළ යුතුය. 2018 වර්ෂය සඳහා ඉදිරිපත් කළ පුනරාවර්තන වියදම් සඳහා මහා භාණ්ඩාගාරයෙන් රුපියල් 552,780,000 ක ප්‍රතිපාදන ලැබුණු අතර, ඒ තුළින් සේවා අවශ්‍යතාවන් සපුරාගැනීම සඳහා රුපියල් 521,040,446ක් වියදම් කොට ඇත. මූලධන වියදම් සඳහා මහා භාණ්ඩාගාරයෙන් රුපියල් 154,880,000 ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් වූ අතර මෙම වර්ෂය තුළ දී අදාළ කාර්යයන් සඳහා රුපියල් 142,539,506 ක් වැය විය.

දෙපාර්තමේන්තුවේ මෙහෙවරට අනුගත වෙමින් සියලුම සංවර්ධන වැඩසටහන් සාර්ථක කරගැනීමට සමාජ සේවා දෙපාර්තමේන්තුවේ සියලුම දිස්ත්‍රික්කවලට අනුයුක්ත කාර්ය මණ්ඩලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත සියලුම ක්ෂේත්‍ර නිලධාරින්, රෝහල්වලට අනුයුක්ත සියලුම ක්ෂේත්‍ර නිලධාරීන් කණ්ඩායම් හැඟීමෙන් දිවා රෑ නොබලා ඉතා උනන්දුවෙන් කැපවීමෙන් කටයුතු කළ බව කෘතවේදීව සිහිපත් කරමි.

ටී.එන්.හෙට්ටිආරච්චි
සමාජ සේවා අධ්‍යක්ෂ

## දැක්ම

**"2030 වන විට ආන්තිකරණයට හා අවාසි සහගත තත්ත්වයන්ට පත් ප්‍රජාවගේ අයිතිවාසිකම් හා සමානාත්මතාවය තහවුරු වූ සුරක්ෂිත ශ්‍රී ලංකාවක් බිහිකිරීමේ පුරෝගාමියා වීම"**

## මෙහෙවර

**"ඉලක්ක ගත ප්‍රජාවගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම හා සවිබලගැන්වීම තුළින් සමාජ අන්තර්කරණය උදෙසා අන්තර් ආයතනික සම්බන්ධීකරණය හා වෘත්තීයවේදීමය මැදිහත්වීම මඟින් නවෝත්පාදන ප්‍රවේශයන් ඔස්සේ වේගවත්ව, කාර්යක්ෂමව හා සඵලදායීව පර්යේෂණ පැවැත්වීම, ප්‍රතිපත්ති සම්පාදනය සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කර ගැනීම "**

## අරමුණු

- වයස අවු.16 - 35 අතර ආබාධ සහිත තරුණ තරුණියන් 500 දෙනෙකුගේ වෘත්තීමය ක්‍රියාකාරකම් හා බාහිර ක්‍රියාකාරකම් සවිබලගැන්වීම.
- භාරකරුවන් අහිමි බුද්ධි ඌණතා ඇති ළමුන් 100ක් සඳහා නේවාසික රැකවරණය ලබාදීම.
- වයස අවුරුදු 0 -18 අතර විවිධ ආබාධවලින් පෙළෙන ළමුන් 100 දෙනෙකුගේ ආබාධිත තත්ත්වය අවම කිරීම සඳහා කල්තියා මැදිහත්වීම.
- ආබාධ සහිත ප්‍රජාව දෛනික ජීවිතයේ දී මුහුණපාන විවිධ ගැටළු අවම කිරීම සඳහා මැදිහත්වීම හා ඔවුන් බලගැන්වීම .
- සංඥා භාෂාව පිළිගැනීම හා ප්‍රවර්ධනය.
- ආබාධ සහිත තැනැත්තන්ට සේවා සපයන ස්වේච්ඡා සංවිධාන බලගැන්වීම.
- මතට ඇබ්බැහිවූවන් 300ක් නේවාසික පුනරුත්ථාපනය කිරීම, ඔවුනට වෘත්තීය පුහුණුව ලබාදීම හා සමාජගත කිරීම.
- විවිධ සමාජ ගැටළුවලට ගොදුරු වූ පුද්ගලයින් සඳහා නිවැරදි මාර්ගෝපදේශකත්වය ලබාදීම .
- ශ්‍රවණාබාධිත වූවන් 500 දෙනෙකු සඳහා ශ්‍රවණාබාධිත හැඳුනුම්පත් ලබා දීම.
- දෙපාර්තමේන්තුවට අනුයුක්ත නිලධාරීන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප උසස් තත්ත්වයට ගෙන ඒම.

## ක්‍රියාකාරකම්

- ආබාධ සහිත තරුණ තරුණියන්ට වෘත්තීය පුහුණුව ලබාදීම, ස්වයං රැකියා සඳහා වෘත්තීය මෙවලම් ලබාදීම හා විවෘත වෙළඳපොළ රැකියා වෙත යොමු කිරීම.
- ආබාධ සහිත වූවන් සඳහා රැකියා වෙළඳපොළ හඳුනාගැනීම හා පුළුල් කිරීම.
- ආබාධ සහිත වූවන්ගේ කාලීන අවශ්‍යතා හා ප්‍රවණතා හඳුනා ගැනීමට පර්යේෂණ කිරීම.
- විශේෂ අවශ්‍යතා ඇති ළමුන් සඳහා කල්තියා මැදිහත් වීම තුළින් ඔවුන් අන්තර්කරණ අධ්‍යාපනය සඳහා යොමු කිරීම.
- ශ්‍රවණාබාධිත වූවන් සඳහා හැඳුනුම්පත් ලබාදීම හා සංඥා භාෂා පරිවර්තන සේවාවන් ලබාදීම තුළින් ශ්‍රවණාබාධිත වූවන්ගේ එදිනෙදා කටයුතු පහසු කිරීම.
- භාරකරුවන් අහිමි බුද්ධි ඌණතා සහිත පිරිමි ළමුන් සඳහා රැකවරණය සැපයීම.
- ආබාධ සහිත පුද්ගලයින්ගේ සුභසාධනය සඳහා පවත්වාගෙන යනු ලබන ස්වේච්ඡා සංවිධාන සඳහා මූල්‍යාධාර සැපයීම.
- වයස අවු. 60ට අඩු දෘශ්‍යාබාධ සහිත තැනැත්තන් සඳහා අක්ෂි කාච ලබාදීම හා වෛද්‍යාධාර සැපයීම, දෘෂ්‍යාබාධ සහිත තැනැත්තන්ගේ අයිතීන් සුරක්ෂිත කිරීම සඳහා ක්‍රීඩා, අධ්‍යාපනික හා සංස්කෘතික ආධාර ලබා දීම, ඔවුන්ගේ ආයතන සඳහා යටිතල පහසුකම් සැපයීම හා වෙනත් සුභසාධන කටයුතු.
- ප්‍රජා මූලික අන්තර්කරණ සංවර්ධන වැඩසටහන යටතේ ආබාධ සහිත වූවන් සඳහා අවැසි සේවා ලබා දීම.
- ප්‍රාදේශිය මට්ටමින් ආබාධ සහිත පුද්ගලයන්ගේ ස්වශක්ති සංවිධාන පිහිටුවීම හා බලගැන්වීම.
- මතට ඇබ්බැහි වූවන් නේවාසිකව පුනරුත්ථාපනය කිරීම හා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- දෙපාර්තමේන්තුවට අනුයුක්ත නිලධාරීන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප වැඩිදියුණු කිරීම සඳහා දේශීය හා විදේශීය පුහුණු, සම්මන්ත්‍රණ, වැඩසටහන් හා වැඩමුළු සඳහා යොමු කිරීම.

## උපාය මාර්ග

i. **ආබාධ සහිත තරුණ තරුණියන්ගේ වෘත්තීයමය ක්‍රියාකාරකම් නව තාක්ෂණ ක්‍රමවේදයන් උපයෝගී කර ගනිමින් පවතින වෙළඳපොළට සරිලන පරිදි සංවර්ධනය කිරීම.**

ii. **සාර්ථකව පුහුණුව නිමකළ අභ්‍යාසලාභීන්ගේ ස්වයං රැකියා සඳහා මෙවලම් කට්ටල ලබාදීම හා පෞද්ගලික ව්‍යාපාරික ආයතනවල රැකියා අවස්ථා හඳුන්වා දීම.**

iii. **පවතින වෙළඳපොළට සරිලන පරිදි වෘත්තීය පුහුණු පාඨමාලා නවීකරණය කිරීම සඳහා යටිතල පහසුකම් ඇති කිරීම.**

iv. **වෘත්තීය පුහුණුව සඳහා අභ්‍යාසලාභීන් වැඩි පිරිසක් ඇතුළත් කර ගැනීමට හැකිවන පරිදි සියලුම පළාත්වල වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන පිහිටුවීම.**

v. **ආබාධ සහිත ප්‍රජාවට දෛනිකව මුහුණ දීමට සිදුවන ගැටළු අවම කර ගැනීම සඳහා ඔවුන්ගේ සහභාගිත්වයෙන් යුක්ත වූ ස්වශක්ති සංවිධාන ප්‍රාදේශීය මට්ටමින් පිහිටුවීම.**

vi. **ආබාධ සහිත ප්‍රජාවට ඍජු ප්‍රතිපාදන ලබාදීම. ( ජල පහසුකම්, විදුලි පහසුකම්, ප්‍රවේශ පහසුකම්, වැසිකිළි පහසුකම් යනාදිය)**

vii. **භාරකරුවන් අහිමි බුද්ධි ඌණතා සහිත ළමුන් සඳහා පවත්වාගෙන යනු ලබන රැකවරණ මධ්‍යස්ථාන පුළුල් කිරීම සඳහා යටිතල පහසුකම් ලබාදීම හා පළාත් මට්ටමින් රැකවරණ මධ්‍යස්ථාන පිහිටු වීම.**

viii. **දෙපාර්තමේන්තුවට අනුයුක්ත නිලධාරීන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප උසස් තත්ත්වයට ගෙන ඒම සඳහා දේශීය හා විදේශීය පුහුණු, සම්මන්ත්‍රණ, වැඩසටහන් හා වැඩමුළු හා පුහුණු පාඨමාලා සඳහා යොමු කිරීම.**


## ඉලක්ක කණ්ඩායම්

i. ආබාධ සහිත පුද්ගලයින්
ii. වැඩිහිටියන්
iii. තනි මාපිය පවුල්
iv. මතට ඇබ්බැහි වූවන්
v. මානසික පීඩා සහිත අය
vi. වීදි දරුවන්, යාචකයන්
vii. වකුගඩු රෝගීන්
viii. තැලසීමියා රෝගීන්, පිළිකා රෝගීන්
ix. ක්ෂය රෝගීන්, ලාදුරු රෝගීන්
x. බන්ධනාගාරගත වූවන්ගේ පවුල්
xi. හදිසි ආපදා තත්වයන්ට පත්වූවන්
xii. උපදේශන කටයුතු
xiii. සමාජ ආරක්ෂක කටයුතු
xiv. අනාථ/ අත්හළ පුද්ගලයන්
xv. අයාලේ යන්නන් හා ගණිකාවන්
xvi. ව්‍යසනයන්/ උවදුරුවලට ලක්වූවන් හා ඔවුන්ගේ පවුල්
xvii. චිරාත් කාලීන රෝග නිසා රෝහල් ගතව පීඩාවට පත්වන පුද්ගලයින් හා පවුල්
xviii. මානසික රෝගීන්
xix. විගමනික පවුල්වල සාමාජිකයන්

## සමාජ සේවා දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය 2018-12-31

| තනතුර | සේවය | ශ්‍රේණිය | වැටුප්තලය රා.ප.ච. 03/2016 | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|---|---|
| අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ප.සේ. | I | SL 1 | 1 | 1 | - |
| අතිරේක අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ප.සේ. | I | SL 1 | 1 | - | 1 |
| ප්‍රධාන ගණකාධිකාරි | ශ්‍රී.ලං.ග.සේ. | I | SL 1 | 1 | 1 | - |
| ප්‍රධාන අභ්‍යන්තර විගණක | ශ්‍රී.ලං.ග.සේ. | I | SL 1 | 1 | 1 | - |
| ගණකාධිකාරී | ශ්‍රී.ලං.ග.සේ. | II/ III | SL 1 | 1 | - | 1 |
| නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ප.සේ. | II/ III | SL 1 | 3 | - | 3 |
| සමාජ සුභසාධන අධිකාරී | ස.සේ.දෙ. | I /II/ III | SL 1 | 2 | 2 | - |
| ස්ථානභාර නිලධාරි | ස.සේ.දෙ. | I /II/ III | MN 7 | 5 | - | 5 |
| පරිපාලන නිලධාරි | රා.ක.ස.සේ. සුප්‍ර | | MN 7 | 1 | 1 | - |
| සමාජ සේවා නිලධාරි | ස.සේ.දෙ. | I/ II | MN 5 | 480 | 289 | 15 |
| සමාජ සංවර්ධන සහකාර | ආශ්‍රිත සේවා | I/ II/ III | MN 4 | | 03 | - |
| සංවර්ධන නිලධාරි | ස.නි.සේ. | I/ II/ III | MN 4 | | 173 | - |
| දෘශ්‍යාබාධිත සංවර්ධන නිලධාරි | ස.සේ.දෙ. | I/ II /III | MN 4 | 13 | 9 | 4 |
| ආධුනික භාෂා පරිවර්තක | කොන්ත්‍රාත් | - | MN 4 | 1 | - | 1 |
| භෞත චිකිත්සක | පරිපූරක වෛද්‍ය සේවය | I/ II/ III | MT 6 | 1 | - | 1 |
| වෘත්තීය චිකිත්සක | පරිපූරක වෛද්‍ය සේවය | I/ II/ III | MT6 | 1 | - | 1 |
| කථන චිකිත්සක | ස.සේ.දෙ. | I/ II/ III | MT5 | 1 | - | 1 |
| වැඩ කළමනාකරු | ස.සේ.දෙ. | I/ II/ III | MT3 | 5 | 1 | 4 |
| වෘත්තීය උපදේශක | ස.සේ.දෙ. | I/ II/ III | MT1 | 59 | 43 | 16 |
| වෘත්තීය උපදේශක | කොන්ත්‍රාත් | - | MT1 | 9 | 3 | 6 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | තො.ස.තා.ස.සේ. | I/ II/ III | MT1 | 1 | 1 | - |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | රා.ක.ස.සේ. | I/ II/ III | MN2 | 46 | 44 | 2 |
| සංඥා භාෂා පරිවර්තක | ස.සේ.දෙ. | I/ II/ III | MN2 | 26 | 6 | 20 |
| පෙර පාසල් ගුරු | ස.සේ.දෙ. | I/ II/ III | MN1 | 3 | 3 | - |
| නිවාස පාලක | ස.සේ.දෙ. | I/ II/ III | MN1 | 14 | 7 | 7 |
| රියදුරු | රියදුරු සේ. | I/ II/ III | PL 3 | 13 | 12 | 1 |
| අරක්කැමි | ස.සේ.දෙ. | I/ II/ III | PL 2 | 9 | 7 | 2 |
| ළමා සංවර්ධන සහකාර | ස.සේ.දෙ. | I/ II/ III | PL 1 | 5 | 5 | - |
| අරක්කැමි සහායක | ස.සේ.දෙ. | I/ II/ III | PL 1 | 15 | 14 | 1 |
| උපස්ථායක | ස.සේ.දෙ. | I/ II/ III | PL 1 | 32 | 32 | - |
| කාර්යාල කාර්ය සහායක | කා.කා.සේ. | I/ II/ III | PL 1 | 42 | 33 | 9 |
| පුනරුත්ථාපන සහායක | කොන්ත්‍රාත් | - | PL 1 | 9 | 6 | 3 |
| එකතුව | | | | 801 | 697 | 104 |

# සංවිධාන ව්‍යුහය
# සමාජ සේවා දෙපාර්තමේන්තුව



# 1 වන පරිච්ඡේදය

## මූල්‍ය ප්‍රගතිය

| කාණ්ඩය | ප්‍රතිපාදන රු. | වියදම රු. | ප්‍රතිශතය |
|---|---|---|---|
| පුනරාවර්තන | 552,780,000 | 521,040,446 | 94.26% |
| ප්‍රාග්ධන | 154,880,000 | 142,539,506 | 92.03% |
| එකතුව | 707,660,000 | 663,579,952 | 93.77% |

වැඩසටහන 01 - මෙහෙයුම් වැඩසටහන
ව්‍යාපෘතිය 01 - පරිපාලන හා ආයතන සේවා
පුනරාවර්තන වියදම්

| කාණ්ඩය | 2018 වර්ෂයේ ඇස්තමේන්තුව රු. | 2018 වර්ෂයේ මුළු වියදම රු. |
|---|---|---|
| පුද්ගල පඩිනඩි | 22,000,000 | 21,484,932 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 19,580,000 | 18,902,103 |
| මුළු පුනරාවර්තන වියදම් | 41,580,000 | 40,387,035 |

වැඩසටහන 02 - සංවර්ධන වැඩසටහන
ව්‍යාපෘතිය 02 - සමාජ සේවාවන් සඳහා මුදල්
පුනරාවර්තන වියදම්

| කාණ්ඩය | 2018 වර්ෂයේ ඇස්තමේන්තුව රු. | 2018 වර්ෂයේ මුළු වියදම රු. |
|---|---|---|
| පුද්ගල පඩිනඩි | 235,800,000 | 220,181,688 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 19,850,000 | 16,204,465 |
| මුළු පුනරාවර්තන වියදම් | 255,650,000 | 236,386,153 |

වැඩසටහන 02 - සංවර්ධන වැඩසටහන
ව්‍යාපෘතිය 03 - පුනරුත්ථාපන හා පුහුණු කිරීම් සේවා
පුනරාවර්තන වියදම්

| කාණ්ඩය | 2018 වර්ෂයේ ඇස්තමේන්තුව රු. | 2018 වර්ෂයේ මුළු වියදම රු. |
|---|---|---|
| පුද්ගල පඩිනඩි | 94,850,000 | 94,224,186 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 160,700,000 | 150,043,465 |
| මුළු පුනරාවර්තන වියදම | 255,550,000 | 244,267,258 |

**2018 වර්ෂයේ අත්තිකාරම් ගිණුමේ සීමාවන්**

| | ඇස්තමේන්තු ගත සීමාවන් රු. | සත්‍ය සීමාවන් රු. |
|---|---|---|
| උපරිම වියදම් සීමාව | **25,000,000** | **21,942,354** |
| අවම ලැබීම් සීමාව | **16,000,000** | **19,568,803** |
| උපරිම හර ශේෂ සීමාව | **95,000,000** | **55,083,629** |

**2018 වර්ෂයේ ආදායම් ඒකරාශී කිරීම්**

| ආදායම් සීමාව | සීමාව | වියදම් රු. |
|---|---|---|
| **2002-01-01** රජයේ ගොඩනැගිලි | | **47,060** |
| **2002- 02- 99** පොලිය වෙනත් (ර.නි.අ.පො.) | | **2,062,937** |
| **(2003 - 99 -000)** අනෙකුත් ලැබීම් | | **1,414,416** |

**ශීර්ෂය - 216 සමාජ සේවා දෙපාර්තමේන්තුව**
**01 - මෙහෙයුම් වැඩසටහන**
**01 - පරිපාලනය හා ආයතන සේවා**
**පුනරාවර්තන වියදම්**

| වැය විෂය | අයිතමය | ඇස්තමේන්තුව රු. | වියදම් රු. |
|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | | **22,000,000** | **21,484,932** |
| **1001** | වැටුප් හා වේතන | 14,500,000 | 14,306,695 |
| **1002** | අතිකාල හා නිවාඩු දින වැටුප් | 1,000,000 | 998,328 |
| **1003** | වෙනත් දීමනා | 6,500,000 | 6,179,909 |
| ගමන් වියදම් | | **1,000,000** | **877,946** |
| **1101** | දේශීය | 400,000 | 339,277 |
| **1102** | විදේශීය | 600,000 | 538,669 |
| සැපයීම් | | **3,562,000** | **3,357,121** |
| **1201** | ලිපි ද්‍රව්‍ය හා කාර්යාලයීය අවශ්‍යතා | 1,600,000 | 1,598,449 |
| **1202** | ඉන්ධන | 1,742,000 | 1,563,108 |
| **1203** | ආහාර පාන හා නිල ඇඳුම් | 220,000 | 195,564 |
| නඩත්තු වියදම් | | **1,300,000** | **1,276,858** |
| **1301** | වාහන | 1,140,000 | 1,118,710 |
| **1302** | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 160,000 | 158,148 |
| සේවා | | **13,258,000** | **13,097,703** |
| **1401** | ප්‍රවාහන | 1,358,000 | 1,346,334 |
| **1402** | තැපැල් හා සන්නිවේදනය | 1,100,000 | 1,092,668 |
| **1403** | විදුලිය සහ ජලය | 2,600,000 | 2,524,613 |
| **1408** | මෙහෙයුම් කල්බදු ක්‍රමයට ප්‍රසම්පාදිත වාහන සඳහා වාරික ගෙවීම් | 6,500,000 | 6,434,581 |
| **1409** | වෙනත් | 1,700,000 | 1,699,507 |
| මාරු කිරීම් | | **360,000** | **236,475** |
| **1506** | රජයේ සේවකයින් සඳහා දේපල ණය පොලී | 360,000 | 236,475 |
| වෙනත් පුනරාවර්තන වියදම් | | **100,000** | **56,000** |
| **1703** | රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම | 100,000 | 56,000 |

**ශීර්ෂය - 216 සමාජ සේවා දෙපාර්තමේන්තුව**
**02 - සංවර්ධන වැඩසටහන**
**02 - සමාජ සේවාවන් සඳහා මුදල් ආධාර**
**පුනරාවර්තන වියදම්**

| වැය විෂය | අයිතමය | ඇස්තමේන්තුව රු. | වියදම රු. |
|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | | **235,800,000** | **220,181,688** |
| **1001** | වැටුප් හා වේතන | 171,500,000 | 159,452,960 |
| **1002** | අතිකාල හා නිවාඩු දින වැටුප් | 3,800,000 | 2,021,996 |
| **1003** | වෙනත් දීමනා | 60,500,000 | 58,706,732 |
| ගමන් වියදම් | | **11,900,000** | **9,353,677** |
| **1101** | දේශීය | 11,000,000 | 9,218,465 |
| **1102** | විදේශීය | 900,000 | 135,212 |
| සැපයීම් | | **2,180,000** | **2,130,523** |
| **1201** | ලිපිද්‍රව්‍ය හා කාර්යාලයීය අවශ්‍යතා | 2,000,000 | 1,951,948 |
| **1202** | ඉන්ධන | 100,000 | 98,703 |
| **1203** | ආහාර පාන හා නිල ඇඳුම් | 80,000 | 79,872 |
| නඩත්තු වියදම් | | **170,000** | **92,832** |
| **1301** | වාහන | 100,000 | 67,663 |
| **1302** | යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ | 70,000 | 25,169 |
| සේවා | | **1,100,000** | **1,083,763** |
| **1402** | තැපැල් සහ සන්නිවේදන | 100,000 | 98,027 |
| **1409** | වෙනත් | 1,000,000 | 985,736 |
| මාරු කිරීම් | | **4,500,000** | **3,543,670** |
| **1506** | රජයේ සේවකයින් සඳහා දේපල ණය පොලී | 4,500,000 | 3,543,670 |

ශීර්ෂය - 216 සමාජ සේවා දෙපාර්තමේන්තුව
02 - සංවර්ධන වැඩසටහන
03 - පුනරුත්ථාපන හා පුහුණු කිරීම් සේවා
පුනරාවර්තන වියදම්

| වැය විෂය | අයිතමය | ඇස්තමේන්තුව රු. | වියදම රු. |
|---|---|---|---|
| පුද්ගල පඩි නඩි | | **94,850,000** | **94,224,186** |
| 1001 | වැටුප් හා වේතන | 62,000,000 | 61,637,627 |
| 1002 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 3,850,000 | 3,841,383 |
| 1003 | වෙනත් දීමනා | 29,000,000 | 28,745,176 |
| ගමන් වියදම් | | **1,750,000** | **1,713,520** |
| 1101 | දේශීය | 1,350,000 | 1,348,720 |
| 1102 | විදේශීය | 400,000 | 364,800 |
| සැපයීම | | **40,180,000** | **38,439,269** |
| 1201 | ලිපිද්‍රව්‍ය හා කාර්යාලයීය අවශ්‍යතා | 1,600,000 | 1,589,802 |
| 1202 | ඉන්ධන | 1,500,000 | 1,303,055 |
| 1203 | ආහාර පාන හා නිල ඇඳුම් | 37,000,000 | 35,466,440 |
| 1204 | වෛද්‍ය සැපයීම් | 80,000 | 79,972 |
| නඩත්තු වියදම් | | **2,100,000** | **2,077,425** |
| 1301 | වාහන | 950,000 | 940,601 |
| 1302 | යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ | 450,000 | 437,416 |
| 1303 | ගොඩනැඟිලි සහ ඉදිකිරීම් | 700,000 | 699,408 |
| සේවා | | **25,620,000** | **24,287,929** |
| 1401 | ප්‍රවාහන | 120,000 | 81,686 |
| 1402 | තැපැල් සහ සන්නිවේදන | 750,000 | 738,800 |
| 1403 | විදුලිය සහ ජලය | 4,200,000 | 3,691,681 |
| 1404 | බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු | 50,000 | 26,630 |
| 1409 | වෙනත් | 20,500,000 | 19,749,132 |
| මාරු කිරීම් | | **1,250,000** | **1,233,641** |
| 1506 | රජයේ සේවකයින් සඳහා දේපල ණය පොලී | 1,250,000 | 1,233,641 |
| **1-1501** විවිධ හැකියා සහිත පුද්ගලයන් සඳහා (වෘත්තීය පුහුණු ආයතන) | | **30,800,000** | **26,047,796** |
| **2 – 1501** මතට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය | | **4,000,000** | **2,970,144** |
| **13 – 1501** - අභ්‍යාසලාභී දීමනා | | **32,000,000** | **30,732,825** |
| **3 – 1508** දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල | | **8,000,000** | **8,000,000** |
| **8 - 1508** විවිධ හැකියා සහිත පුද්ගලයින්ගේ විනෝදාත්මක හා ක්‍රීඩා කටයුතු සඳහා පහසුකම් සැලසීම | | **15,000,000** | **14,537,522** |

**2018 වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රතිපාදන හා වියදම්**

| ව්‍යාපෘති අංකය | වැය ශීර්ෂය | ක්‍රියාකාරකම් | ප්‍රතිපාදන රු. | වියදම රු. |
|---|---|---|---|---|
| 01. | 2002 | යන්ත්‍ර සූත්‍ර හා උපකරණ අළුත්වැඩියාව | 400,000 | 45,872 |
| | 2003 | වාහන අළුත්වැඩියාව | 700,000 | 700,000 |
| | 2102 | කාර්යාලයීය උපකරණ හා ගෘහ භාණ්ඩ මිලදී ගැනීම | 815,000 | 813,005 |
| | 2103 | යන්ත්‍ර සූත්‍ර හා උපකරණ මිලදී ගැනීම | 725,000 | 723,875 |
| | 2106 | මෘදුකාංග සංවර්ධනය | 660,000 | 654,696 |
| | 2401 | පුහුණු කිරීමේ හා හැකියා වර්ධනය | 700,000 | 681,509 |
| | | උප එකතුව | **4,000,000** | **3,618,957** |
| | 2401 | පුහුණු කිරීමේ හා හැකියා වර්ධනය - කාර්ය මණ්ඩල පුහුණු | 2,300,000 | 2,113,395 |
| 02. | | උප එකතුව | **2,300,000** | **2,113,395** |
| | 2001 | ගොඩනැගිලි අළුත්වැඩියාව හා නවීකරණය | 2,100,000 | 1,994,517 |
| 03. | 2002 | යන්ත්‍ර සූත්‍ර හා උපකරණ අළුත්වැඩියාව | 800,000 | 370,114 |
| | 2003 | වාහන අළුත්වැඩියාව | 1,500,000 | 1,459,125 |
| | 2102 | කාර්යාලයීය උපකරණ හා ගෘහ භාණ්ඩ මිලදී ගැනීම | 3,180,000 | 3,165,436 |
| | 2103 | යන්ත්‍ර සූත්‍ර හා උපකරණ මිලදී ගැනීම. | 3,100,000 | 2,954,798 |
| | 2104 | නව ඉදිකිරීම් | 1,300,000 | 1,129,446 |
| | 2401 | පුහුණු කිරීම් හා හැකියා වර්ධනය | 1,600,000 | 711,539 |
| | 5 - 2509 | ප්‍රජා පාදක පුනරුත්ථාපන ව්‍යාපෘතිය | 15,000,000 | 14,506.661 |
| | 6 - 2104 | ගොඩනැගිලි ඉදිකිරීම හා නවීකරණය | 7,600,000 | 7,339,132 |
| | 9 - 2104 | ගොඩනැගිලි ඉදිකිරිම (ළමා මාර්ගෝපදේශ මධ්‍යස්ථානය - කොට්ටාව) | 5,000,000 | 4,388,962 |
| | 10 - 2104 | ගොඩනැගිලි ඉදිකිරිම (වෘත්තීය පුහුණු ආයතනය - කිළිනොච්චිය) | 32,400,000 | 32,400,000 |
| 04. | 11 - 2104 | ගොඩනැගිලි ඉදිකිරිම (වෘත්තීය පුහුණු ආයතනය - මඩකලපුව) | 40,000,000 | 40,000,000 |
| 05. | 12 - 2104 | මන්ද මානසික කාන්තාවන් සඳහා රැකවරණ නිවාසයක් ඉදිකිරීම - පුවක්පිටිය | 35,000,000 | 26,387,424 |
| | | උප එකතුව | **148,580,000** | **136,807,154** |
| | | මුළු එකතුව | **154,880,000** | **142,539,506** |

වැඩසටහන 02 - සංවර්ධන වැඩසටහන
ව්‍යාපෘතිය 03 - පුනරුත්ථාපනය හා පුහුණු කිරීම් සේවා
වැය ශීර්ෂය 2001 ගොඩනැගිලි අළුත්වැඩියාව හා නවීකරණය - 2018

| අනු අංකය | අයිතම | ඇස්තමේන්තුව රු. | වියදම රු. |
|---|---|---|---|
| 01. | නාවින්න ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය | | |
| | I. ළමුන්ගේ එළිමහන් නාන ස්ථානයට බිත්තිය සහිත වහලයක් සකස් කිරීම | 413,535 | |
| | II. සංවේදී කාමරය අළුත්වැඩියාව | 40,761 | |
| 02. | වත්තේගම වෘත්තීය පුහුණු ආයතනය | | |
| | I. රාක්ක අළුත්වැඩියාව | 97,000 | |
| | II. නාම පුවරු සැකසීම | 58,800 | |
| 03. | ජයවිරු සමාධි ආයතනය - පුවක්පිටිය | | |
| | I. අප ජලය ගලායාම සඳහා කාණුවක් ඉදිකිරීම | 200,000 | |
| | II. ජල පොකුණෙහි බැම්ම නවීකරණය කිරීම | 250,000 | |
| 04. | ජයවිරු සෙවණ ආයතනය - පුවක්පිටිය | | |
| | I. නව ගොඩනැගිල්ල හා වැසිකිළි පද්ධතිය යාකරමින් වැසි ආවරණයක් ඉදිකිරීම | 100,000 | **1,994,517** |
| | II. වැසිකිළි පද්ධතිය නවීකරණය කිරීම. | 100,000 | |
| 05. | මාදම්පේ වෘත්තීය පුහුණු ආයතනය | | |
| | I. පුහුණු අංශයේ කාමරයක් වෙන්කර සැකසීම. | 169,128 | |
| | II. ජල ටැංකිය රැඳවීම සඳහා ස්ථානයක් සකස් කිරීම | 113,804 | |
| 06. | සීදූව වෘත්තීය පුහුණු ආයතනය | | |
| | I. නාම පුවරු | 49,800 | |
| 07. | විහව් වෘත්තීය පුහුණු ආයතනය - කලවාන | | |
| | I. වෘත්තීය පුහුණු අංශවල අළුතින් සකස් කළ කොටසේ වැඩ අවසන් කිරීම හා දැල් ආවරණ යොදා පන්ති කාමර 03ක් වෙන් කිරීම | 365,000 | |
| 08. | අමුණුකුඹුර වෘත්තීය පුහුණු ආයතනය | | |
| | I. නාන කාමරය අළුත්වැඩියා කිරීම | 101,272 | |
| | එකතුව | **2,100,000** | **1,994,517** |

වැඩසටහන - 02 - සංවර්ධන වැඩසටහන
ව්‍යාපෘතිය - 03 - පුනරුත්ථාපන හා පුහුණු කිරීම් සේවා
වැය ශීර්ෂය - 2104 ගොඩනැගිලි ඉදිකිරීම් - 2018

| අනු අංකය | අයිතම | ඇස්තමේන්තුව රු. | වියදම රු. |
|---|---|---|---|
| 01. | ජයවිරු සමාධි ආයතනය - පුවක්පිටිය | | |
| | I. වැසිකිළි පද්ධතියක් සකස් කිරීම | 1,059,785 | |
| 02. | අමුණුකුඹුර වෘත්තීය පුහුණු ආයතනය | | |
| | I. තාප්පය ඉදිකිරීම | 225,070 | **1,129,446** |
| | ඉතුරු මුදල | 15,145 | |
| | එකතුව | **1,300,000** | **1,129,446** |

වැඩසටහන - **02** - සංවර්ධන වැඩසටහන
ව්‍යාපෘතිය - **03** - පුනරුත්ථාපන හා පුහුණු කිරීම් සේවා
වැය ශීර්ෂය - **06** - **2104** - ගොඩනැගිලි ඉදිකිරීම් - **2018**

| අනු අංකය | අයිතම | ඇස්තමේන්තුව රු. | වියදම රු. |
|---|---|---|---|
| **01.** | තෙළඹුයාය වෘත්තීය පුහුණු ආයතනය | | |
| | I. ජල ටැංකිය ඉදිකිරීම | 2,000,000 | |
| | II. පිරිමි නේවාසිකාගාරයේ ජනෙල්වලට ග්‍රීල් සවි කිරීම | 580,816 | |
| | III. ප්‍රවේශ මාර්ගයට ඉන්ටලොක් ගල් ඇතිරීම (අවිච්ඡේද) | 1,465,756 | |
| **02.** | සීදුව වෘත්තීය පුහුණු ආයතනය | | |
| | I. කාර්යාලය අසල සිට පුහුණු අංශය දක්වා ප්‍රවේශ මාර්ගය, වහලය හා අත්වැට සකස් කිරීම. | 476,945 | |
| **03.** | අමුණුකුඹුර වෘත්තීය පුහුණු ආයතනය | | **7,339,132** |
| | I. නව ගොඩනැගිල්ල ඉදිරිපස ගේට්ටුවක් සකස් කිරීම. | 171,072 | |
| **04.** | ජයවිරු සෙවණ ආයතනය - පුවක්පිටිය (අවිච්ඡේද) | | |
| | I. ශ්‍රවණාගාරය හා නිල නිවාසය ප්‍රතිසංස්කරණය කිරීම. | 2,675,984 | |
| **05.** | විහව් වෘත්තීය පුහුණු ආයතනය - කලවාන (අවිච්ඡේද) | | |
| | I. මුළුතැන්ගෙය ඉදිරිපස කාණු පද්ධතිය ඉදිකිරීම, පිවිසුම් දොරටුව අසල බැම්ම සෑදීම හා වැට සකස් කිරීම. | 139,653 | |
| | එකතුව | **7,600,000** | **7,339,132** |

# 2 වන පරිච්ඡේදය

## ආබාධ සහිත වූවන් සඳහා වන සුභසාධන හා සංවර්ධන වැඩසටහන

- ❖ ආබාධ සහිත තරුණ තරුණියන් පුනරුත්ථාපනය කිරීම, වෘත්තීය පුහුණුව ලබා දීම හා සමාජගත කිරීම.
- ❖ මුල් ළමාවියේදීම ඇතිවන ආබාධ සහිත තත්ත්වයන් හඳුනාගෙන අවශ්‍ය මැදිහත් වීම හා සංවර්ධනය කිරීම.
- ❖ භාරකරුවන් අහිමි බුද්ධි ඌණතා ඇති පිරිමි ළමුන් සඳහා රැකවරණය සැපයීම.
- ❖ ආබාධ සහිත පුද්ගලයින් සඳහා වූ ප්‍රජා මූලික අන්තර්කරණ සංවර්ධන ජාතික වැඩසටහන.
- ❖ දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල.
- ❖ ආබාධ සහිත දරුදැරියන්ගේ ක්‍රීඩා හා කලා කුසලතා සංවර්ධන වැඩසටහන.

### ❖ ආබාධ සහිත තරුණ තරුණියන් පුනරුත්ථාපනය කිරීම, වෘත්තිය පුහුණුව ලබා දීම හා සමාජගත කිරීම.

#### i. හැඳින්වීම

දෙපාර්තමේන්තුව යටතේ පවත්වාගෙන යනු ලබන වෘත්තීය පුහුණු ආයතන 08ක් සඳහා ඇතුළත් කර ගන්නා ආබාධ සහිත තරුණ තරුණියන්ට වෘත්තීය පුහුණුව ලබාදීම මෙම වැඩසටහන මඟින් සිදුකෙරේ. ගම්පහ, මහනුවර, රත්නපුර, හම්බන්තොට හා පුත්තලම යන දිස්ත්‍රික්කවල මෙම වෘත්තීය පුහුණු ආයතන පිහිටුවා ඇති අතර දිවයින පුරාම විසිරී සිටින ආබාධ සහිත තරුණ තරුණියන්ගේ වෘත්තීමය හැකියාවන් බලගැන්වීම ඒ මඟින් සිදු කෙරේ.

වයස අවු. 16 – 35 ත් අතර කිසියම් පුහුණුවකට සුදුසුකම් ඇති ආබාධ සහිත තරුණ තරුණියන් සම්මුඛ පරීක්ෂණයකින් පසු ඔවුන්ගේ හැකියාවන්ට ගැලපෙන පුහුණු පාඨමාලාවන් සඳහා තෝරා ගැනේ. පාඨමාලාවේ ස්වභාවය අනුව පුහුණු කාලය වෙනස් වන අතර ඒ අනුව වසරක හෝ වසර දෙකක විධිමත් පුහුණුවක් තෝරාගත් අභ්‍යාසලාභීන් සඳහා ලබාදේ. විවිධ වූ පාඨමාලා 26ක් යටතේ මෙම පුහුණුව ලබාදෙන අතර පුහුණු කාලය තුළ නේවාසික පහසුකම්, ආහාරපාන, දෛනික දීමනා හා වෛද්‍ය පහසුකම් නොමිලේ සැපයේ. 2018 වර්ෂයේ සාර්ථකව පුහුණුව නිමකළ අභ්‍යාසලාභීන් සඳහා ස්වයං රැකියා සඳහා මෙවලම් කට්ටල හා විධිමත් සහතිකය පත්‍ර ලබාදී ඔවුන් රැකියා ගත කිරීමට හා සමාජ ගත කිරීමට කටයුතු කර ඇත.

## වෘත්තීය පුහුණු ආයතන විසින් පවත්වාගෙන යනු ලබන පාඨමාලා


01. ගුවන්විදුලි, රූපවාහිනි යන්ත්‍ර සහ ආශ්‍රිත උපකරණ කාර්මික ශිල්පය
02. ශීතකරණ හා වායු සමීකරණ කාර්මික ශිල්පය
03. වඩු කාර්මික හා ලී කැටයම් ශිල්පය
04. මහන යන්ත්‍ර ක්‍රියා කරවීම (කර්මාන්ත ශාලා)
05. හස්ත කර්මාන්ත ශිල්පය (උණ ගස් ආශ්‍රිත සහ පොල් ආශ්‍රිත)
06. හස්ත කර්මාන්ත ශිල්පය (කොසු සහ ඉදල්)
07. හස්ත කර්මාන්ත ශිල්පය (වේවැල් හා කොහු)
08. හස්ත කර්මාන්ත ශිල්පය (විසිතුරු)
09. ඇඳුම් මැසීමේ ශිල්පය
10. ටේලරින් ශිල්පය
11. සම්බාහන චිකිත්සාව (නිල තෙරපුම)
12. පෙදරේරු කාර්මික ශිල්පය
13. මෝටර් රථ කාර්මික ශිල්පය
14. යන්ත්‍ර ශිල්පය
15. විදුලි ශිල්පය
16. මෝටර් රථ පින්තාරු ශිල්පය
17. පැස්සුම් ශිල්පය
18. සිමෙන්ති නිෂ්පාදන ශිල්පය
19. පාවහන් හා සම් කාර්මාන්ත ශිල්පය
20. බතික් නිර්මාණ ශිල්පය
21. බේකරි හා ආහාර තාක්ෂණ ශිල්පය
22. ගෙවතු වගාව හා කෘෂිකාර්මික ශිල්පය
23. පේෂ කර්ම ශිල්පය
24. පරිඝණක ශිල්පය
25. ත්‍රීරෝද රථ කාර්මික ශිල්පය
26. රූපලාවන්‍ය

**ii. ක්‍රියාකාරකම් -**

- ආබාධ සහිත තරුණ තරුණියන් සඳහා වෘත්තීය පුහුණුව ලබා දීම.
- විධිමත් පරිදි පුහුණුව නිම කළ අභ්‍යාසලාභීන් සඳහා සහතික පත් ලබා දීම හා සමාජ ගත කිරීම.
- ස්වයංරැකියා සඳහා මෙවලම් කට්ටල ලබා දීම හා විවෘත වෙළඳපොළ අංශයේ රැකියා අවස්ථා හඳුන්වාදීම .

**iii. ස්ථානය - දිවයිනේ දිස්ත්‍රික් 05 ක මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ.**

## සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ පවත්වාගෙන යනු ලබන වෘත්තීය පුහුණු ආයතන




**2018 වර්ෂයේ වෘත්තීය පුහුණු ආයතන අනුව අභ්‍යාසලාභීන් ගණන**

| අනු අංකය | ආයතනය | 2018 අභ්‍යාසලාභීන් සංඛ්‍යාව |
|---|---|---|
| 01. | සීදූව වෘත්තීය පුහුණු ආයතනය | 115 |
| 02. | කැටවල වෘත්තීය පුහුණු ආයතනය | 30 |
| 03. | වත්තේගම වෘත්තීය පුහුණු ආයතනය | 80 |
| 04. | තෙළඹුයාය වෘත්තීය පුහුණු ආයතනය | 78 |
| 05. | අමුණුකුඹුර වෘත්තීය පුහුණු ආයතනය | 65 |
| 06. | කලවාන වෘත්තීය පුහුණු ආයතනය | 24 |
| 07. | මාදම්පේ වෘත්තීය පුහුණු ආයතනය | 22 |
| 08. | රාගම වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය | 26 |
| | එකතුව | 440 |

**2018 සමාජ සේවා දෙපාර්තමේන්තුව මඟින් ස්වේච්ඡා ආයතනවල පුහුණුව ලබන අභ්‍යාසලාභීන් සඳහා දීමනා ලබාදීම.**

| අනු අංකය | ආයතනය | 2018 අභ්‍යාසලාභීන් සංඛ්‍යාව |
|---|---|---|
| 01. | ආබාධිත පුද්ගල සංවර්ධන පදනම - බණ්ඩාරවෙල | 31 |
| 02. | ඉස්ලාමීය ආබාධිත ආයතනය - තිහාරිය | 22 |
| 03. | සී/ස සර්වෝදය සුවසෙත ආයතනය - මොරටුව | 06 |
| 04. | බටුගම්මන වෘත්තීය පුහුණු ආයතනය -බලංගොඩ | 22 |
| 05. | සුඛිත වෘත්තීය පුහුණු ආයතනය - හොරණ | 10 |
| 06. | තලාව ආබාධ සහිත කාන්තා සංගමය - තලාව | 03 |
| 07. | මන්ද මානසික කාන්තා පුනරුත්ථාපන මධ්‍යස්ථානය - රොටුව | 30 |
| 08. | ජාතික මානසික සෞඛ්‍ය සභාව - කොළඹ | 26 |
| 09. | කුසලතා සංවර්ධන මධ්‍යස්ථානය - රාජාංගනය | 43 |
| | එකතුව | 193 |

**iv. ප්‍රතිඵලය / වියදම - 2018/12/31 දිනට**

**(ආබාධ සහිත වූවන් සඳහා වන සුභසාධන හා සංවර්ධන වැඩසටහනේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය 1- 1501)**

| අනු අංකය | ක්‍රියාකාරකම් | ප්‍රතිපාදන රු. | වියදම රු. |
|---|---|---|---|
| 01. | පුහුණුව සඳහා අමුද්‍රව්‍ය හා වෙනත්<br>I. අමු ද්‍රව්‍ය<br>II. වෙනත් සුභසාධන වියදම්<br>III. උපදේශන පුහුණු දීමනා<br>IV. අධ්‍යාපන චාරිකා | | 14,210,538 |
| 02. | විධිමත් පරිදි වෘත්තීය පුහුණුව නිම කළ අභ්‍යාසලාභීන් සඳහා මෙවලම් කට්ටල ලබා දීම.<br>I. රු. 15,000/- ක් වටිනා මෙවලම් කට්ටල 184ක් ලබාදීම.<br>II. අභ්‍යාසලාභීන් 52ක් සඳහා මහන මැෂින් 52ක් ලබාදීම | | 2,760,000<br>1,554,800 |
| 03. | නාවින්න ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය<br>I. සේවාලාභීන්ගේ පැමිණීමේ දීමනාව ලබා දීම.<br>II. සංග්‍රහ වියදම්<br>III. චිකිත්සකවරුන් සඳහා දීමනා ගෙවීම. | | 718,300<br>25,250<br>356,200 |
| 04. | දෙපාර්තමේන්තුව යටතේ මූල්‍ය අනුග්‍රහ ලබන ස්වේච්ඡා සංවිධානවල නඩත්තු හා යථායෝග්‍යාධාර ලබාදීම.<br>I. බිහිරි සේවා මණ්ඩලය<br>II. ස්වර්ණදාම පදනම | | 100,000 |
| 05. | බුද්ධි ඌනතා ළමුන්ගේ පෙර පාසල් ගුරුවරුන් සඳහා දීමනා ලබා දීම<br>I. වීරකැටිය අරුණැල්ල විශේෂ පාසැල - ගුරුවරුන් 02ක් සඳහා<br>II. හ/කටුවන රිටිගහයාය පෙර පාසල - ගුරුවරුන් 02ක් සඳහා<br>III. බඩල්කුඹුර ලිට්ල් ෆ්ලවර්ස් ළමා කුසලතා සංවර්ධන මධ්‍යස්ථානය - ගුරුවරු 03ක් සඳහා<br>IV. නුවරඑළිය වොල්ට්‍රීම් කුසලතා සංවර්ධන මධ්‍යස්ථානය - ගුරුවරුන් 03ක් සඳහා<br>V. තෝලංගමුව ළමා මාර්ගෝපදේශන මාස්ථානය - ගුරුවරුන් 03ක් සඳහා<br>VI. ඉබ්බාගමුව විශේෂ අධ්‍යාපන මධ්‍යස්ථානය - ගුරුවරුන් 01ක් සඳහා<br>VII. මාලමුල්ල කුසලතා සංවර්ධන මධ්‍යස්ථානය - ගුරුවරුන් 01ක් සඳහා | **30,800,000** | 901,800 |
| 06. | 2018 ජාතික මලල ක්‍රීඩා උළෙල සඳහා (ටී ෂර්ට්, බොටම්, කැප්, සපත්තු සහ මේස් ) | | 2,084,939 |
| 07. | වෘත්තීය පුහුණු ආයතනවල නිල ඇඳුම් (ටී ෂර්ට්,බොටම්) | | 1,436,842 |

| | | | |
|---|---|---|---|
| 08. | ස්වේච්ඡා ආයතනවල අභ්‍යාසලාභීන් සඳහා ප්‍රවාහන, තේ සහ කෙටි ආහාර දීමනා<br>I. නුවරඑළිය - වොල්ට්‍රිම් කුසලතා සංවර්ධන මධ්‍යස්ථානය<br>II. තෝලංගමුව ළමා මාර්ගෝපදේශ මධ්‍යස්ථානය<br>III. රාජාංගනය කුසලතා සංවර්ධන මධ්‍යස්ථානය<br>IV. ඉබ්බාගමුව විශේෂ අධ්‍යාපන මධ්‍යස්ථානය<br>V. බඩල්කුඹුර ළමා සංවර්ධන මධ්‍යස්ථානය<br>VI. මාලමුල්ල කුසලතා සංවර්ධන මධ්‍යස්ථානය | | 1,899,127 |
| 09. | ශ්‍රව්‍යාබාධිත වූවන් සඳහා හැඳුනුම්පත් ලබාදීම. (412) | | |
| 10. | ශ්‍රව්‍යාබාධිතයන් සඳහා සංඥා භාෂා පරිවර්තන සේවය ලබා දීම. | | |
| | එකතුව | **30,800,000** | **26,047,796** |

ආබාධ සහිත වූවන්ගේ සුභසාධන වැඩසටහන
භෞතික හා මූල්‍ය ප්‍රගතිය 13 - 1501

| අනු අංකය | ක්‍රියාකාරකම් | ප්‍රතිපාදන රු. | වියදම රු. |
|---|---|---|---|
| 01. | දෙපාර්තමේන්තුව යටතේ පවත්වාගෙන යනු ලබන වෘත්තීය පුහුණු ආයතනවල ආබාධ සහිත අභ්‍යාසලාභීන් 440ක් සඳහා අභ්‍යාසලාභී දීමනා (එක් ළමයෙකුට රු. 150/-) | **32,000,000** | **30,732,825** |
| 02. | දෙපාර්තමේන්තුවේ මූල්‍ය අනුග්‍රහය ලබන ස්වේච්ඡා වෘත්තීය පුහුණු ආයතනවල අභ්‍යාසලාභීන් 193ක් සඳහා අභ්‍යාසලාභී දීමනා (එක් ළමයෙකුට රු.75/-සහ එක් ළමයෙකුට රු. 25/-බැගින් ප්‍රවාහන දීමනා.) | | |

### ❖ ළමා මාර්ගෝපදේශන වැඩසටහන

#### i. හැඳින්වීම

ළමයෙකුගේ මුල් ළමාවියේ දී වර්ධනයේ කිසියම් වෙනසක් හෝ ප්‍රමාදයක් හෝ ඇති බවට සැක සහිත අවස්ථාවක ඒ සඳහා කල් ඇතිව මැදිහත් වී දරුවා සංවර්ධනය කිරීමට අවශ්‍ය මාර්ගෝපදේශකත්වය ලබා දීම මෙම වැඩසටහන මඟින් සිදුකෙරේ. නිවැරදි මාර්ගෝපදේශයක් ලබාගැනීමේ අපේක්ෂාවෙන් ආයතනයට පැමිණෙන දෙමාපියන්ගෙන් දරුවාගේ ජීවන තොරතුරු ලබාගෙන ලියාපදිංචි කර, දරුවන්ගේ අවශ්‍යතා හඳුනාගෙන වර්ධන තත්ත්වයේ නිවැරදි තක්සේරුවක් සිදු කිරීමයි. විස්තරාත්මක තත්ත්ව වාර්තාවක් සැලසීමෙන් අනතුරුව ගුරුවරුන් දෙමාපියන් සමඟ සාකච්ඡා කර දරුවන්ගේ කුසලතාවයන් අනුව සුදුසු පන්ති කාමරයකට යොමු කිරීම සිදුකෙරේ. මෙම දරුවන්ගේ වර්ධන තත්ත්වයන්

හා කුසලතාවන් පිළිබඳ වාර්තා අර්ධ වාර්ෂිකව සකස් කරන අතර තවදුරටත් සේවා ලබා ගැනීමට අවශ්‍යනම් දිගුකාලීනව පසුහාර කටයුතු සිදුකෙරේ.

- 2018 වර්ෂයේ ලියාපදිංචි වූ නවක ළමුන් සංඛ්‍යාව - 61
- පෙර පාසල්වලට යොමු කළ ළමුන් සංඛ්‍යාව - 15
- පාසල්වලට යොමු කළ ළමුන් සංඛ්‍යාව - 05

2018 වර්ෂයේ ලියාපදිංචි ළමුන් වයස් මට්ටම් අනුව

| අනු අංකය | වයස අවු. | සංඛ්‍යාව |
|---|---|---|
| I. | 0 - 3 | 15 |
| II. | 4 - 5 | 27 |
| III. | 6 - 15 | 17 |
| IV. | 16 ට වැඩි | 02 |
| | මුළු එකතුව | 61 |

එක් එක් අංශ මගින් ලබාදුන් සේවා පිළිබඳ විස්තර

| අනු අංකය | ලබා දුන් සේවය | ළමුන් සංඛ්‍යාව | සේවා වාර ගණන |
|---|---|---|---|
| I. | භෞතික චිකිත්සක ප්‍රතිකාර | 111 | 391 |
| II. | කථන චිකිත්සක ප්‍රතිකාර | 132 | 710 |
| III. | වෘත්තීය චිකිත්සක ප්‍රතිකාර | 110 | 311 |
| IV. | අධ්‍යාපන අංශය | | 7448 |

2018 වර්ෂයේ ලියාපදිංචි වූ ළමුන් (ආබාධ මට්ටම් අනුව)

| අනු අංකය | ආබාධයේ ස්වභාවය | ළමුන් සංඛ්‍යාව |
|---|---|---|
| I. | ඔටිසම් (Autism ) | 11 |
| II. | මස්තිෂ්ක ආඝාතය (Curable Palsy ) | 09 |
| III. | ඩවුන් සින්රෝම් (Down Syndrome ) | 08 |
| IV. | වර්ධනය අඩු බව (Global Development delay) | 04 |
| V. | කථන හා භාෂා ගැටළු (Speech Delay) | 02 |
| VI. | අධික්‍රියාකාරී (Hyperactive ) | 02 |
| VII. | වෙනත් | 04 |
| | එකතුව | 61 |

ලියාපදිංචි වූ ළමුන් යොමු වූ ආකාරය අනුව

| අනු අංකය | යොමු වූ ආකාරය | සංඛ්‍යාව |
|---|---|---|
| 01. | රිච්වේ ආර්යා ළමා රෝහල මගින් | 13 |
| 02. | සේවාලාභී දෙමාපියන් මගින් | 24 |
| 03. | පෙර පාසල් ගුරුවරුන් මගින් | 06 |
| 04. | පාසල්, අධ්‍යාපන ආයතන, රාජ්‍ය ආයතන මගින් | 13 |
| 05. | විවිධ මාධ්‍ය හා අන්තර්ජාලය මගින් | 03 |
| 06. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල - ක්ෂේත්‍ර නිලධාරීන් මගින් | 02 |

ii. ක්‍රියාකාරකම්

- ළමා ආබාධ කල් ඇතිව හඳුනාගෙන ඒ සඳහා මැදිහත්වීමේ වඩාත් ඵලදායී ක්‍රමවේදයන් හඳුන්වා දීම.
- ආබාධ සහිත දරුවන්ට සේවා සැපයීම සම්බන්ධව විවිධ ක්ෂේත්‍රවලට අදාළ සේවා ජාලය ශක්තිමත් කිරීම
- විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ මුල් ළමාවිය අධ්‍යාපනය හා අන්තර්කරණ අධ්‍යාපනය ශක්තිමත් කිරීම.
- දෙමාපියන්ගේ හා පවුලේ සාමාජිකයන්ගේ මානසික තත්වය වඩාත් යහපත් තත්වයට ගෙන ඒම සඳහා උපදේශන සේවා පවත්වාගෙන යාම.

iii. ස්ථානය - මහරගම ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය පතිරගොඩ, වෙල පාර, නාවින්න

iv. ඉලක්ක කණ්ඩායම - වයස අවු. 0 – 18 දක්වා

v. ප්‍රතිඵලය - විශේෂ අවශ්‍යතා ඇති ළමුන් 61ක් සඳහා අවශ්‍ය සේවා ලබාදීම

### ❖ දෙමාපියන් සහ භාරකරුවන් අහිමි බුද්ධි ඌණතා සහිත පිරිමි ළමුන් සඳහා රැකවරණය ලබා දීම.

i. හැඳින්වීම -

දෙමාපියන් සහ භාරකරුවන් අහිමි විවිධ වයස් මට්ටම් ඇති බුද්ධි ඌණතා සහිත පිරිමි ළමුන්ට රැකවරණය ලබා දීම මෙම ව්‍යාපෘතිය මඟින් සිදුකෙරේ. මුළු ජීවිත කාලයම නේවාසිකව සිටින මෙම ළමුන් හුදකලා නොකොට ආදරයෙන් සෙනෙහසින් රැකබලා ගන්නා අතරම දෛනික ක්‍රියාකාරකම් සඳහා යොමු කෙරේ. නේවාසික පහසුකම් ඇතුළුව ආහාර පාන හා වෛද්‍ය පහසුකම් නොමිලේ ලබාදීම සිදු කෙරේ.

ii. ක්‍රියාකාරකම්

- බුද්ධි ඌණතා ඇති ළමුන් 100 ක් සඳහා රැකවරණය සැපයීම.
- ඔවුන් නිසා පවුල්වල සාමාජිකයින් අතර ඇතිවන කායික හා මානසික ගැටළු අවම කිරීම.
- පවුලේ සෙසු සාමාජිකයින්ගේ ආර්ථික, අධ්‍යාපන හා සංස්කෘතික දියුණුව සඳහා මැදිහත් වීම.

iii. ස්ථානය - අවිස්සාවේල්ල, පුවක්පිටිය, නොර්ත් අම්බලම්වත්ත, ජයවිරු සෙවන (රැකවරණ මධ්‍යස්ථානය )

iv. ඉලක්ක කණ්ඩායම - බුද්ධි ඌණතා සහිත පිරිමි ළමුන්

v. ප්‍රතිඵල - බුද්ධි ඌණතා සහිත ළමුන් 74 ක් සඳහා රැකවරණය ලබාදීම.

**2018 වර්ෂයේ රැකවරණය ලබාදුන් ළමුන් - ආබාධ මට්ටම් අනුව**

| අනු අංකය | ආබාධිත තත්ත්වය | සංඛ්‍යාව |
|---|---|---|
| 01. | මන්දමානසික | 58 |
| 02. | මානසික රෝගී | 04 |
| 03. | කථන හා ශ්‍රව්‍ය | 04 |
| 04. | චලන | 04 |
| 05. | දෘශ්‍ය | 03 |
| 06. | බහුවිධ | 01 |
| | එකතුව | **74** |

## ❖ ප්‍රජා මූලික පුනරුත්ථාපන ජාතික වැඩසටහන (සී.බී.ආර්.)

i. හැඳින්වීම

ආබාධ සහිත පුද්ගලයින්ගේ ජාතික ප්‍රතිපත්තියට අනුව, ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරමින් වගකීම් හා යුතුකම් ඉටු කිරීමට හැකිවනු පිණිස ඔවුන් දැනුමෙන් හා කුසලතාවලින් සවිබලගැන්වීම මෙම වැඩසටහන තුළින් ප්‍රධානවම සිදුකෙරේ. එසේම එම ප්‍රජාවගේ පවුල්වල සාමාජිකයින්ගේ ආර්ථික හා සාමාජික යහපැවැත්ම තහවුරු කිරීමේ විවිධ වැඩසටහන්ද මේ යටතේ ක්‍රියාත්මක වේ.

ii. ක්‍රියාකාරකම්

- ආබාධ සහිත වූවන් සඳහා සෘජු ප්‍රතිපාදන ලබා දීම හා පසුහාර කටයුතු සිදු කිරීම (කොමඩ්, ජලය, විදුලිබල පහසුකම් හා ප්‍රවේශ පහසුකම් ලබා දීම යනාදිය)
- ප්‍රාදේශීය මට්ටමින් ආබාධ සහිත පුද්ගලයන්ගේ ස්වශක්ති සංවිධාන පිහිටුවීම හා බලගැන්වීම.

- රාජ්‍ය හා රාජ්‍ය නොවන වෙනත් සංවිධාන සමග ඒකාබද්ධව සේවා අවශ්‍යතා ලබා ගැනීමට පහසුකම් ඇති කිරීම.
- ආබාධ සහිත ළමුන් සඳහා පවත්වාගෙන යනු ලබන කුසලතා සංවර්ධන මධ්‍යස්ථාන සඳහා යටිතල පහසුකම් සැපයීම.

iii. ස්ථානය - දිවයිනේ දිස්ත්‍රික්ක 25 හිම මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ.
iv. ඉලක්ක කණ්ඩායම - දිවයිනේ ජීවත්වන සියලුම ආබාධ සහිත ප්‍රජාව
v. ප්‍රතිඵලය හා වියදම -

ප්‍රජා මූලික පුනරුත්ථාපන වැඩසටහන - 2018 මූල්‍ය හා භෞතික ප්‍රගතිය 2 - 3 - 5 - 2509

| ව්‍යාපෘතිය | වැඩසටහන | භෞතික ප්‍රගතිය | ඇස්තමේන්තුව රු. මිලියන | වියදම රු.මිලියන |
|---|---|---|---|---|
| ස්වශක්ති සංවිධාන ඇගයීම 2018 | බිම් මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා ස්වශක්ති සංවිධාන ඇගයීම - ත්‍යාග හා සම්මාන ප්‍රදානය | 01 | 1.600 | 1.585 |
| සෘජු ආධාර | • ආබාධ සහිත ප්‍රජාව සඳහා<br>• කොමඩ් වැසිකිලි - 300<br>• විදුලිය ලබාගැනීමට - 10<br>• ප්‍රවේශ මාර්ග පහසුකම් -15<br>• වායු මෙට්ට ලබා දීම - 46<br>• ජල මෙට්ට ලබාදීම - 27<br>• ජල පහසුකම් - 22<br>• වෙනත් ආධාර - 70 | 495 | 7.028 | 7.165 |
| ප්‍රගති සමාලෝචන රැස්වීම් | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හා දිස්ත්‍රික්කවල සිදු කරන ලද ක්‍රියාකාරකම්වල ප්‍රගතිය හා දුර්වලතා සාකච්ඡා කිරීම | 402 | 1.134 | 4.259 |
| ස්වශක්ති සංවිධාන බලගැන්වීම | බිම් මට්ටමේ සිට ජාතික තලය දක්වා ව්‍යාප්තව ඇති සංවිධාන ශක්තිමත් කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. | 453 | 1.780 | |
| ආබාධ සහිත දරුවන් පුනරුත්ථාපනය | එක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට රු.5000/- බැගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 331 ප්‍රතිපාදන යොමු කිරීම. | 2901 | 1.655 | |
| ප්‍රචාරණය | පොත් සහ අත් පත්‍රිකා එළිදැක්වීම | 10000 | 0.101 | 0.109 |
| ක්ෂේත්‍ර නිරීක්ෂණය | සියලුම ව්‍යාපෘතිවල ප්‍රගතිය නිරීක්ෂණය කිරීම | 05 | 0.060 | 0.077 |
| පුහුණු වැඩසටහන් පැවැත්වීම | රෝහල් සඳහා අනුයුක්තව සිටින දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා විෂය පථයට අදාළ පුහුණුව ලබාදීම. | 03 | 0.100 | 0.001 |

| | | | | |
|---|---|---|---|---|
| දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රැස්වීම - ප්‍රධාන කාර්යාලය | දිස්ත්‍රික්කවලට අනුයුක්ත සියලුම ක්ෂේත්‍ර නිලධාරීන්ගේ ගැටළු සාකච්ඡා කිරීම සහ ප්‍රගති සමාලෝචනය රැස්වීම - එක් කාර්තුවකට එක බැඟින් රැස්වීම් 04ක් පැවැත්වීම. | 04 | 0.050 | 0.005 |
| වෘත්තීය පුහුණු පාඨමාලා පිළිබඳ ආබාධ සහිත ප්‍රජාව දැනුවත් කිරීම | වෘත්තීය පුහුණු ආයතනවලට සෘජුවම ආබාධ සහිත ළමුන් යොමු කිරීම සම්බන්ධව කොට්ඨාස මට්ටමින් දැනුවත් කිරීම | | 1.242 | 0.995 |
| පරිපාලන වියදම් | | | 0.250 | 0.307 |
| එකතුව | | | **15.000** | **14.503** |

## ❖ දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල

### i. හැඳින්වීම

දෘශ්‍යාබාධිත තත්වයට පත්වන පුද්ගලයන්ට අවශ්‍ය සේවා සැපයීම, පුනරුත්ථාපනය කිරීම හා සහන ලබාදීම මෙම අරමුදලේ මෙහෙවර වේ. ශ්‍රී ලංකාව තුළ ආබාධ සහිත පුද්ගලයන් පිළිබඳ නව ආකල්ප වර්ධනය ක්‍රමයෙන් ආරම්භ වූයේ 1981 වර්ෂය ජාත්‍යන්තර ආබාධිත වර්ෂය ලෙස ප්‍රකාශයට පත් කිරීමත් සමඟය. ඒ අනුව යමින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව මඟින් 1992 අංක 09 දරණ "දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල" නමින් පනතක් සම්මත කර රජයේ ගැසට් නිවේදනයක් මඟින් ප්‍රකාශයට පත් කොට ඇත. මෙම පනතට සමගාමීව ශ්‍රී ලංකාවේ වෙසෙන දෘශ්‍යාබාධිත පුද්ගලයන් වෙනුවෙන් විවිධ සේවාවන් ලබා දීම සිදු කෙරේ.

### ii. ක්‍රියාකාරකම්

- ස්වයං රැකියා කරගෙන යාම සඳහා ආධාර සැපයීම.
- ක්‍රීඩා කටයුතු පවත්වාගෙන යාම හා වැඩිදියුණු කිරීමට ආධාර සැපයීම.
- අධ්‍යාපනික හා සංස්කෘතික කටයුතු සඳහා ආධාර සැපයීම.
- දෘශ්‍යාබාධිත විශ්වවිද්‍යාල සිසුන්ට ශිෂ්‍යාධාර ලබාදීම.
- උසස් පෙළ හදාරන දෘශ්‍යාබාධිත සිසුන් සඳහා මුදල් ආධාර සැපයීම.
- අඩු ආදායම්ලාභීන්ට නොමිලයේ අක්ෂිකාච ලබා දීම.
- සුභසාධන කටයුතු පවත්වාගෙන යාම.
- දෘශ්‍යාබාධිත කාන්තා සුභසාධන මධ්‍යස්ථාන පවත්වාගෙන යාම.
- පරිපාලන කටයුතු පවත්වාගෙන යාම.
- විභාග ගාස්තු ගෙවීම.
- අවශ්‍යතා මත අරමුදලේ පරමාර්ථයන් ඉටු කිරීම සඳහා විවිධ වියදම් දැරීම.

- වලතාවය හා දිසානතිය පුහුණු ලබාදීම සඳහා උපදේශන දීමනා ගෙවීම.

iii. ස්ථානය - සමාජ සේවා දෙපාර්තමේන්තුව
iv. ඉලක්ක කණ්ඩායම - දෘශ්‍යාබාධිත පුද්ගලයින්
v. ආරම්භ කළ දිනය - 1992
vi. ප්‍රතිඵලය හා වියදම -

දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල - මූල්‍ය ප්‍රගතිය 2018

| අනු අංකය | වැඩසටහන හා ප්‍රගතිය | ඇස්තමේන්තුව රු. | වියදම රු. |
|---|---|---|---|
| 01. | **ක්‍රීඩා ආධාර**<br>I. ශ්‍රී ලංකා දෘශ්‍යාබාධිත ක්‍රිකට් කණ්ඩායම ඉන්දු - ලංකා තරඟාවලිය සඳහා සහභාගී කරවීම<br>II. රත්මලාන අන්ධ විද්‍යාලය - ක්‍රීඩා ඇඳුම් මිලදී ගැනීම සඳහා<br>III. බලංගොඩ යසෝදරා අඳ බිහිරි පාසැල - ක්‍රීඩා උපකරණ මිලදී ගැනීම සඳහා | 300,000 | 230,450 |
| 02. | **වෘත්තීය පුහුණු උපදේශක දීමනා**<br>I. සීදුව වෘත්තීය පුහුණු ආයතනයේ සංගීත ගුරු දීමනා ගෙවීම.<br>II. සීදුව වෘත්තීය පුහුණු ආයතනයේ වෙස් ක්‍රීඩා උපදේශක වෙත දීමනා ගෙවීම.<br>III. බලංගොඩ බටුගම්මන රියන්සි අලගියවන්න ආබාධිත වෘත්තීය පුහුණු ආයතනයේ කොහු උපදේශක වෙත දීමනා ගෙවීම<br>IV. රත්මලාන අන්ධ විද්‍යාලයේ සේවා පුහුණු ව්‍යාපෘතිය සඳහා පුහුණු අභ්‍යාසලාභී ගෙවීම් කිරීම . | 400,000 | 354,500 |
| 03. | **පුනරුත්ථාපන ආධාර**<br>I. අන්ධ ජන සේවා මණ්ඩලය උපදේශකවරුන් 07 ක් සඳහා ගෙවීම් කිරීම හා පුහුණුලාභීන් 16ක් සඳහා ගෙවීම් කිරීම.<br>II. ශ්‍රී ලංකා දෘශ්‍යාබාධිත උපාධිධාරි මණ්ඩලයේ දෘශ්‍යාබාධිත ගුරුවරුන්ගේ ධාරිතා සංවර්ධන වැඩමුළුව - ගුරුවරුන් 60 ක් සඳහා<br>III. කථන ග්‍රන්ථ 45ක් සැකසීම | 1,000,000 | 892,200 |
| 04. | **අධ්‍යාපන හා සංස්කෘතික ආධාර**<br>I. එක් සිසුවෙකුට මාසිකව රු. 2000/- බැගින් අ.පො.ස. (උසස් පෙළ) සිසුන් 22ක් සඳහා ශිෂ්‍යාධාර ගෙවීම.<br>II. එක් සිසුවෙකුට මාසිකව රු. 1000/- බැගින් විශ්වවිද්‍යාල සිසුන් 101ක් සඳහා ශිෂ්‍යාධාර ගෙවීම.<br>III. දෑස් නොපෙනෙන දෙමාපියන්ගේ දැස්පෙනෙන එක් දරුවෙකුට මාසිකව රු.500/- බැගින් දරුවන් 208ක් සඳහා ශිෂ්‍යාධාර ගෙවීම.<br>IV. එක් සිසුවෙකුට මාසිකව රු. 750/- බැගින් අ.පො.ස. (සා.පෙළ) දෘශ්‍යාබාධිත සිසුන් 87ක් සඳහා ශිෂ්‍යාධාර ගෙවීම.<br>V. කාලය සඟරාව (බ්‍රේල්) 90ක් සකස් කර බෙදාහැරීම සඳහා මාසිකව රු.13500/- ආධාර ගෙවීම . | 2,540,000 | 2,681,750 |

| | | | |
|---|---|---|---|
| 05. | ජාත්‍යන්තර සුදු සැරයටි දින සැමරුම් ජාතික උත්සවය<br>I. දෘශ්‍යාබාධිත වූවන් 350කගේ සහභාගිත්වයෙන් සුදු සැරයටි දින සැමරුම් උත්සවය 2018 නොවැම්බර් මස 15 වන දින සුහුරුපාය ශ්‍රවණාගාරයේ දී පැවැත්වීම.<br>II. විශ්ව විද්‍යාල දෘශ්‍යාබාධිත උපාධි අපේක්ෂකයන් 25ක් සඳහා රු.26,000/- වටිනා E10 daisy Recorder ලබාදීම.<br>III. එක් සිසුවෙකුට රු. 10,000/- බැගින් 2018 වර්ෂයේ ශිෂ්‍යත්ව විභාගයෙන් විශිෂ්ඨ ලෙස සමත් සිසුන් 03ක් සඳහා ශිෂ්‍යත්ව ලබාදීම.<br>IV. එක් සිසුවෙකුට රු. 15,000/- බැගින් 2018 වර්ෂයේ අ.පො.ස. (සා.පෙළ.) විශිෂ්ඨ ලෙස සමත් සිසුන් 03ක් ඇගයීම.<br>V. සුදු සැරයටි දින උත්සවයට ගායන අංශයෙන් සහභාගි වූ එක් කලාකරුවෙකුට රු.10,000/- බැඟින් දෘශ්‍යාබාධිත කලාකරුවන් 04ක් සහ රු. 5000/- බැගින් දෙදෙනෙකුටත් මුදල් ත්‍යාග ලබාදීම.<br>VI. එක් කලාකරුවෙකුට රු.30,000/- දෘශ්‍යාබාධිත ප්‍රවීණ කලාකරුවන් 03ක් සඳහා මුදල් ත්‍යාග ලබාදීම.<br>VII. සුදු සැරයටි උත්සවය සඳහා විෂන් දෘෂ්‍යාබාධිත සංගීත කණ්ඩායමේ සහය ලබාගැනීම වෙනුවෙන් රු. 50,000ක් ගෙවීම් කිරීම.<br>VIII. සුදු සැරයටි උත්සව දින පැවැත් වූ විශේෂ දේශනය වෙනුවෙන් රු.30,000/-ක් ගෙවීම් කිරීම. | 2,000,000 | 2,101,506 |
| 06. | අක්ෂි කාච හා අක්ෂි ප්‍රතිකාර<br>අක්ෂි කාච 03ක් සඳහා ලබාදීම. | 200,000 | 46,600 |
| 07. | දෘශ්‍යාබාධිත කාන්තා සුභසාධන මධ්‍යස්ථානය | 400,000 | 232,000 |
| | උපදේශිකා 01<br>සහායිකා 01<br>දෘශ්‍යාබාධිත කාන්තාවන් 10 | | |
| 08. | පරිපාලන වියදම් | 1,160,000 | 657,834 |
| 09. | විගණන ගාස්තු | | 89,700 |
| 10. | මුල්‍ය වියදම් | | 13,202 |
| 11 | විවිධ වියදම් | | 25,587 |
| | එකතුව | **8,000,0000** | **7,325,329** |

## ❖ ආබාධ සහිත දරුදැරියන්ගේ සංස්කෘතික හා කලා කුසලතා සංවර්ධන වැඩසටහන

I. හැඳින්වීම

සමාජ සේවා දෙපාර්තමේන්තුව, ආබාධ සහිත දරුදැරියන්ගේ වෘත්තීමය හැකියාවන් බලගැන්වීම සිදු කරන අතරම ඔවුන් සෞන්දර්යෙන් හෙබි සෞඛ්‍ය සම්පන්න ක්‍රියාශීලී පුද්ගලයන් ලෙස සමාජ ගතකිරීම සඳහා ද මූලික වී කටයුතු සිදු කරයි. ඒ සඳහා දිවයිනේ සියලුම ආබාධ සහිත තරුණ තරුණියන් නියෝජනය වන පරිදි ඔවුන්ගේ ක්‍රීඩා හා කලා කුසලතාවන් දිස්ත්‍රික්ක මට්ටමින් හඳුනාගෙන සෑම වසරකම ජාතික ක්‍රීඩා හා කලා ප්‍රසංග පැවැත්වීම සිදු කොට ඇත. දිස්ත්‍රික් මට්ටමින් පවත්වන ලද තරඟවලින් ජයග්‍රහණය කරන පුද්ගලයින් හා කණ්ඩායම් ජාතික මට්ටමේ තරඟ සඳහා යොමු කිරීමත් ඉන් අනතුරුව ජයග්‍රාහකයින් සඳහා ත්‍යාග, සම්මාන හා සහතික පත් පිරිනැමීමක් සිදු කෙරේ.

ශ්‍රී ලාංකීය සංස්කෘතික සිරිත් විරිත් පිළිබඳ සජීවී අත්දැකීම් විඳගැනීමේ අවස්ථාව ආබාධ සහිත දරුවන්ට ලබා දීම, සෙසු අය මෙන් මොවුන්ගේ ක්‍රීඩාව සහ නර්තනය කෙරෙහි තිබෙන හැකියාව ඔප්නැංවීම, ආබාධ සහිත ප්‍රජාව පිළිබඳ සමාජයේ තිබෙන පාරම්පරික ආකල්ප වෙනස් කිරීම හා ඔවුන් සමාජ පිළිගැනීමට ලක්කිරීම මෙම වැඩසටහන් මඟින් අපේක්ෂා කෙරේ. මේ යටතේ ක්‍රියාත්මක කෙරෙන ප්‍රධාන ජාතික වැඩසටහන් 03 කි.

i. ආබාධ සහිත දරු දැරියන්ගේ ජාතික කලා ප්‍රසංගය - "සිත් රූ"
ii. ආබාධ සහිත තැනැත්තන්ගේ ජාතික මලල ක්‍රීඩා උළෙල
iii. ආබාධ සහිත දරුවන්ගේ බක්මහ උළෙල

මූල්‍ය හා භෞතික ප්‍රගතිය - 2018

වැය ශීර්ෂය 216 - 2 – 3 - 8 - 1508

| අනු අංකය | වැඩසටහන | ස්ථානය හා දිනය | ප්‍රතිපාදන රු. මිලියන | වියදම රු. මිලියන | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| 01. | ආබාධ සහිත වූවන්ගේ සිත් රූ 2018 සංස්කෘතික ප්‍රසංගය සඳහා දිස්ත්‍රික්ක මට්ටමින් කණ්ඩායම් තරග පැවැත්වීම. (පුහුණු කටයුතු අනෙකුත් අවශ්‍යතා සඳහා - 25 X 30,000) | දිස්ත්‍රික්ක 25 | 6.00 | 6.57 | අභ්‍යාසලාභීන් 375 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ආබාධ සහිත වූවන්ගේ ජාතික සංස්කෘතික කලා ප්‍රසංගය සිත් රූ - 2018 හා සම්මාන උළෙල | නෙළුම්පොකුණ මහින්ද රාජපක්ෂ රඟහල - 2018 සැප්තැම්බර් 06 | | | අභ්‍යාසලාභීන් 270 |
| 02 | ආබාධ සහිත වූවන්ගේ 2018 - ජාතික මළල ක්‍රීඩා උළෙල සඳහා දිස්ත්‍රික්ක මට්ටමින් තරඟ පැවැත්වීම සඳහා ප්‍රතිපාදන ලබාදීම | දිස්ත්‍රික්ක 25 | 7.50 | 6.66 | අභ්‍යාසලාභීන් 4000 ක් පමණ |
| | ආබාධ සහිත වූවන්ගේ ජාතික මළල ක්‍රීඩා උළෙල - 2018 | සුගතදාස ජාතික ක්‍රිඩා සංකීර්ණය 2018 සැප්තැම්බර් 25 | | | අභ්‍යාසලාභීන් 600 |
| 03. | දෙපාර්තමේන්තුව යටතේ ඇති වෘත්තීය පුහුණු ආයතනවල ආබාධ සහිත දරුදැරියන්ගේ බක්මහ උළෙල | බත්තරමුල්ල ජී.එච්. බුද්ධදාස ක්‍රීඩාංගනයේ දී 2018 අප්‍රේල් 25 | 1.50 | 1.31 | අභ්‍යාසලාභීන් 700 |
| | එකතුව | | 15.00 | 14.54 | |

# 3 වන පරිච්ඡේදය

## මතට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීම හා සමාජගත කිරීමේ ව්‍යාපෘතිය

### i. හැඳින්වීම

මතට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කිරීම, සමාජගත කිරීම හා වෘත්තීමය හැකියාවන් වැඩි දියුණු කිරීම මෙම වැඩසටහන මගින් සිදුකෙරේ. හෙරොයින්, ගංජා, කේරළ ගංජා, මධ්‍යසාර හා මත්පෙති භාවිතය නිසා ජීවිතය අඳුරුකරගත් පිරිස් ආයතන ගත කර පුද්ගල සංවර්ධන ක්‍රියාවලියකට යොමු කිරීම සිදුවේ. ආයතනයට ඇතුළත්වීමෙන් පසු ප්‍රධාන වශයෙන්ම සිදු කෙරෙනුයේ මනෝ චිකිත්සක, මනෝ විද්‍යාත්මක උපදේශන ක්‍රමවේදයන් හා වෛද්‍ය විද්‍යාත්මක ප්‍රවේශයන් ඔස්සේ පුනරුත්ථාපන ක්‍රියාවලියට යොමු කිරීමයි. එම කාලය තුළ අභ්‍යාසලාභීන්ගේ අධ්‍යාත්මික සංවර්ධනය සඳහා යෝගී භාවනා හා ආගමික වැඩසටහන් පැවැත්වීම සිදු කෙරේ. අභ්‍යාසලාභීන් පුනරුත්ථාපනය වන කාලය තුළ නේවාසික පහසුකම් ආහාර පාන හා වෛද්‍ය පහසුකම් නොමිලයේ සැපයේ. අභ්‍යාසලාභීන්ගේ ජීවනෝපාය මාර්ග සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය වන වෘත්තීමය හැකියාවන් සංවර්ධනය කිරීමේ පුහුණුවක්ද නේවාසික කාලය තුළ ලබා දෙනු ලැබේ. ආයතන ගතව පුනරුත්ථාපනය කරන අතරම දිවයිනේ තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ග්‍රාම නිලධාරි වසම් හරහා පාසැල් සිසුන් දැනුවත් කිරීමේ හා පවුල් සංවර්ධන වැඩසටහන් ද ක්‍රියාත්මක කෙරේ.

**2018 මත්ද්‍රව්‍ය වර්ගය අනුව අභ්‍යාසලාභීන් ආයතනගත වීම.**

| මත්ද්‍රව්‍ය වර්ගය | සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| හෙරොයින් | 258 | 59.3% |
| ගංජා/ කේරළ ගංජා | 88 | 20.2% |
| මධ්‍යසාර | 56 | 13.0% |
| මත්පෙති | 27 | 06.2% |
| වෙනත්/ විවිධ | 06 | 01.3% |
| එකතුව | 435 | |

ආගම අනුව සංඛ්‍යාව

| ආගම | සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| බෞද්ධ | 269 | 62% |
| ක්‍රිස්තියානි | 109 | 25% |
| ඉස්ලාම් | 33 | 08% |
| හින්දු | 24 | 05% |
| එකතුව | **435** | |

වයස් මට්ටම අනුව සංඛ්‍යාව

| වයස් මට්ටම | සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| අවු. 15ට අඩු | 01 | 0.22 % |
| 16 - 20 | 77 | 17.08 % |
| 21 - 30 | 178 | 41.00 % |
| 31 - 40 | 116 | 26.66 % |
| 40ට අඩු | 63 | 14.48 % |
| එකතුව | **435** | |

අධ්‍යාපන මට්මටම අනුව

| අධ්‍යාපන මට්ටම | සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| අවු. 0 - 6 | 144 | 33.00 % |
| අවු.6- අ.පො.ස. සා/පෙළ | 182 | 42.06 % |
| අ.පො.ස. උසස් පෙළ | 105 | 24.03 % |
| උපාධි | 04 | 0.91 % |
| එකතුව | **435** | |

ක්‍රියාකාරකම්

I. මතට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කිරීම, ඔවුන්ගේ වෘත්තීය හැකියාවන් වැඩි දියුණු කිරීම හා සමාජගත කිරීම.

II. මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීම නිසා ඔවුන්ගේ පවුල් පරිසරය තුළ හටගෙන ඇති ගැටළු අවම කිරීම සඳහා මැදිහත්වීම.

III. මත්ද්‍රව්‍ය භාවිතය නිසා බිඳවැටුණු රැකියාවන් හා අධ්‍යාපනය කටයුතු යථා තත්වයට ගෙන ඒම සඳහා අදාල පර්ශවයන් සමඟ සම්බන්ධතා ගොඩනැගීම.

IV. අවදානම් කණ්ඩායම් සඳහා මත්ද්‍රව්‍ය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

| | |
|---|---|
| ස්ථානය | - අවිස්සාවේල්ල, පුවක්පිටිය, නොර්ත්අම්බලම්වත්ත, ජයවිරු සමාධි නිවහන |
| ඉලක්ක කණ්ඩායම | - මතට ඇබ්බැහි වූවන් 100 ක් පුනරුත්ථාපනය සඳහා ඇතුළත් කර ගැනීම |
| ආරම්භ කළ දිනය | - 2001 වර්ෂයේ |
| ප්‍රතිඵලය | - අභ්‍යාසලාභීන් 435ක් පුනරුත්ථාපනය වී සමාජගත කර ඇත. |

**මත් නිවාරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන මූල්‍ය හා භෞතික ප්‍රගතිය - 2018**

| වැය ශීර්ෂය | ක්‍රියාකාරකම් | 2018 ප්‍රතිපාදන (රු.මි.) | 2018 භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | | | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | |
| 02 - 03 - 02 - 1501 | ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස 50ක් තුළ මත්ද්‍රව්‍ය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාව (එක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට රු.50,000X50) | 4.00 | 2.97 | තෝරා ගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 50 ක ඉලක්කගත ප්‍රජාව දැනුවත් කිරීම. |
| | මතට ඇබ්බැහි වීම වැළක්වීමේ තෙදින වැඩමුළුව | | | උතුරු නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සමාජ සේවා නිලධාරීන් / සමාජ සංවර්ධන නිලධාරීන් හා සංවර්ධන නිලධාරීන් 20ක් සඳහා |
| | ප්‍රගති සමාලෝචන රැස්වීම - ප්‍රධාන කාර්යාලය | | | සමාජ සේවා නිලධාරීන්/ සමාජ සංවර්ධන නිලධරින් හා සංවර්ධන නිලධාරීන් 48ක් |
| | මත්ද්‍රව්‍ය සම්බන්ධ වීදි නාට්‍ය (පූවක්පිටිය ජයවිරු සමාධි ආයතනයේ අභ්‍යාසලාභීන්ගේ දායකත්වයෙන්) | | | විදී නාට්‍ය කණ්ඩායම |
| | මත්ද්‍රව්‍ය වැලැක්වීම සම්බන්ධ ඒකාබද්ධ වැඩමුළුව | | | අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව හෙල්දි ලංකා ආයතනය |

# 4 වන පරිච්ඡේදය

## 2018 වර්ෂයේ දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය සඳහා පවත්වන ලද පුහුණු වැඩසටහන් හා පුහුණු පාඨමාලාවන් හි මූල්‍ය හා භෞතික ප්‍රගතිය

**2016-01-01-2401 පුහුණු වැඩසටහන**

| දේශීය / විදේශීය පුහුණු වැඩසටහන | සහභාගි වූ නිලධාරීන් සංඛ්‍යාව | පුහුණුව ලැබූ කාල සීමාව | ස්ථානය | වියදම රු. |
|---|---|---|---|---|
| පෙර වර්ෂයේ පුහුණු වැඩසටහන් සඳහා කරන ලද ගෙවීම් | | | | 7,004.67 |
| විගණනය පිළිබඳ පුහුණු වැඩසටහන | සමාජ සේවා නිලධාරි/ සංවර්ධන නිලධාරි/ රාජ්‍ය කළමනාකරණ සහකාර නිළධාරීන් 50ක් | 2018.03.22 | සමාජ සේවා දෙපාර්තමේන්තුව | 18,388.00 |
| රියදුරු පුහුණු වැඩසටහන | රියදුරු පුහුණු වැඩසටහන | 2018.06.19 | සමාජ සේවා දෙපාර්තමේන්තුව | 11,842.00 |
| ප්‍රසම්පාදනය සම්බන්ධ තෙදින පුහුණු වැඩමුළුව | සංවර්ධන නිලධාරීන්/ රා.කළ. සහකාර 19 ක් | 2018.07.10 /17/26 | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 129,600.00 |
| Payroll සම්බන්ධ තෙදින පුහුණු වැඩමුළුව | රාජ්‍ය කළ. සහකාර නිලධාරි ජී.කේ.එම්.එම්. නිසංසලා මිය හා එස්.ඒ.ජේ.උමේෂා මිය | 2018.07.24 /25/26 | මිලෝදා ආයතනය | 36,000.00 |
| අභ්‍යන්තර විගණකවරුන් සඳහා වූ කළමනාකරණ විගණන පුහුණු වැඩමුළුව | ප්‍රධාන අභ්‍යන්තර විගණක ඩී.ටී.ඩී.එදිරිසිංහ මිය | 2018.09.02 සිට 2018.09.09 | මැලේසියා | 375,444.55 |
| ආයතන සංග්‍රහය පිළිබඳ දෙදින පුහුණු වැඩමුළුව | රාජ්‍ය කළ. සහකාර නිලධාරි සඳුනි කෝෂිලා මිය හා උමේෂා මධුමාලි මිය. | 2018.11. 27/28 | ශ්‍රී ලංකා පදනම් ආයතනය | 13,000.00 |
| මුදල් රෙගුලාසි පිළිබඳ වැඩමුළුව | රාජ්‍ය කළ.සහකාර ඩී.එම්.යු.එස්. ප්‍රේමරත්න මිය | 2018.11. 27/29 | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 12,500.00 |
| ජාතික විගණන පනත පිළිබඳ සම්මන්ත්‍රණය | ගණකාධිකාරි | 2018.11.29 | ශ්‍රී ලංකා පදනම් ආයතනය | |
| සංඥා භාෂා පරිවර්තකවරුන්ගේ දසවන සමුළුව සඳහා සහභාගි වීම | සංඥා භාෂා පරිවර්තක ජේ.එස්.ඒ. ගුණවර්ධන මයා | 2018.12.20 | ඉන්දියා - ඉන්දෝර් | 44,717.00 |

**2016 - 02- 02 – 2401 -** පුහුණු වැඩසටහන

| වැඩසටහන | නිලධාරී සංඛ්‍යාව | දිනය | ස්ථානය | වියදම රු. |
|---|---|---|---|---|
| පෙර වර්ෂයේ පුහුණු වැඩසටහන් සඳහා කරන ලද ගෙවීම් | | | | 7,004.67 |
| උපදේශන පාඨමාලාව | නවගත්තේගම ප්‍රා.ලේ.කා සංවර්ධන නිලධාරි - අරුණ ජයලත් මයා | 2018.03.14 | ජාතික සමාජ සංවර්ධන ආයතනය | 25,000.00 |
| ව්‍යාපෘති සකස් කිරීම පිළිබඳ දෙදින වැඩමුළුව | සමාජ සේවා නිලධාරී (3ක්) බී.කේ. නයනචන්ද්‍ර මයා , ජයන්ත ප්‍රේමලාල් මයා, ප්‍රේමරත්න කේ. පතිරණ මයා | 2018.06 18/19 | පදනම් ආයතනය | 19,500.00 |
| උපදේශන පාඨමාලාව - | ඇහැටුවැව ප්‍රා.ලේ.කා. සංවර්ධන නිලධාරී රසිකා නිශාමලී මිය | 2018.07. 06 | ජාතික සමාජ සංවර්ධන ආයතනය | 50,000.00 |
| මත්ද්‍රව්‍ය උපදේශනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | පුවක්පිටිය සමාධි නිවහන සමාජ සේවා නිලධාරී ඒ.ජී.ජී. බී.ආර්.කේ. විජේසුන්දර මයා | 2018.07. 07 | අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලය | 15,000.00 |
| නවක සමාජ සේවා නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධන පුහුණු වැඩමුළුව (පළමු අදියර) | සමාජ සේවා නිලධාරීන් 92ක් | 2018.09. 17/18 | ජලජීවී වගා පුහුණු ආයතනය - කලාවැව | 380,585.00 |
| නවක සමාජ සේවා නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධන පුහුණු වැඩමුළුව (දෙවන අදියර) | සමාජ සේවා නිලධාරීන් 84ක් | 2018.10. 30/31 | ජලජීවී වගා පුහුණු ආයතනය - කලාවැව | 369,022.00 |
| **Event Management** දෙදින පුහුණු වැඩසටහන | සංවර්ධන නිලධාරී ශිවන්ති උක්ගහකුඹුර මිය / ජගත් කෝදාගොඩ මයා | 2018.11. 12/13 | නිපුණතා සංවර්ධන අරමුදල | 17,000.00 |
| 2019 ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරීමේ වැඩමුළුව | සමාජ සේවා නිලධාරීන් /සංවර්ධන නිලධාරීන් - 90ක් | 2018.12. 20/21/22 | වාරියපොල වයඹ පුහුණු ආයතනය | 292,531.00 |
| සමාජ වැඩ ඩිප්ලෝමා පාඨමාලාව | සමාජ සේවා නිලධාරීන් 29ක් | 2018.12.27 | සමාජ සංවර්ධන ආයතනය | 912,752.15 |

**216 - 02- 03 -2401 පුහුණු පාඨමාලා**

| වැඩසටහන | තනතුර හා නිලධාරීන් සංඛ්‍යාව | දිනය | ස්ථානය | වියදම රු. |
|---|---|---|---|---|
| පෙර වර්ෂයේ පුහුණු වැඩසටහන් සඳහා ගෙවීම් | | | | 59,517.00 |
| විශේෂ අධ්‍යාපන උපාධිය සඳහා ගෙවීම් | සංඥා භාෂා පරිවර්ථක දිනේශ් ප්‍රනාන්දු මයා | 2018.03.21 | ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය | 25,000.00 |
| ප්‍රසම්පාදනය සම්බන්ධ තෙදින පුහුණු වැඩමුළුව | සමාජ සේවා නිලධාරීන්, සංවර්ධන නිලධාරීන් / රා.ක.ස.නිලධාරීන් 19 | 2018.07.10/ 17/26 | ජාතික ශ්‍රම අධ්‍යන ආයතනය | 136,800.00 |
| පාඨමාලා විෂය නිර්දේශ සැකසීමේ වැඩමුළුව | වෘත්තීය උපදේශක 50ක් | 2018.07.17/ 19 | සමාජ සේවා දෙපාර්තමේන්තුව | 6,455.00 |
| පාඨමාලා විෂය නිර්දේශ සැකසීම | වෘත්තීය උපදේශක | 2018.07.26 | සමාජ සේවා දෙපාර්තමේන්තුව | 2,300.00 |
| පාඨමාලා විෂය නිර්දේශ සැකසීම | වෘත්තීය උපදේශක | 2018.07.31 | සමාජ සේවා දෙපාර්තමේන්තුව | 7,182.00 |
| පාඨමාලා විෂය නිර්දේශ සැකසීම | වෘත්තීය උපදේශක | 2018.08.02 | සමාජ සේවා දෙපාර්තමේන්තුව | |
| උපස්ථායක/ නිවාස පාලක පුහුණු වැඩසටහන | උපස්ථායක/ නිවාස පාලක | 2018.08.16/ 17 | අමුණුකුඹුර වෘත්තීය පුහුණු ආයතනය | 88,235.00 |
| සංඥා භාෂා පුහුණු වැඩමුළුව | මාදම්පේ වෘ.පු. ආ. - ජී.ජී.ඒ.යූ. වික්‍රමසිංහ මිය - උපස්ථායක | 2018.07.25 | ජාතික අධ්‍යාපන ආයතනය | 12,000.00 |
| පාවහන් නිෂ්පාදනය පිළිබඳ තාක්ෂණික පුහුණුව | සීදූව වෘ.පු.ආ. - වෘත්තීය උපදේශක එස්.ඒ. අනුර බණ්ඩාර මයා | 2018.09.27 | කාර්මික සංවර්ධන මණ්ඩලය | 14,000.00 |
| ස්ථාවර වත්කම් හා තොග ලේඛන සකස් කිරීම පිළිබඳ එක්දින වැඩමුළුව | සමාජ සේවා නිලධාරී/ සංවර්ධන නිලධාරී රා.කළ. ස. නිලධාරීන් 90ක් | 2018.11.02 | සමාජ සේවා දෙපාර්තමේන්තුව | 34,115.00 |
| අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව | ළමා සංවර්ධන සහකාර සීතා ධර්මශීලී මිය හා ඩී.එස්.එස්. උඩවත්ත මිය | 2018.11.11 | ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය | 42,500.00 |
| සංඥා භාෂා පරිවර්තකවරුන්ගේ දසවන සමුළුව සඳහා සහභාගි වීම වෙනුවෙන් ලියාපදිංචි විසා ගාස්තු හා අනියම් දීමනා | සංඥා භාෂා පරිවර්තක දිනේෂ් ප්‍රනාන්දු මයා, කාංචනා ප්‍රියදර්ශනී මිය | 2018.12.20 | ඉන්දියා -ඉන්දෝර් | 149,434.00 |
| කාර්ය මණ්ඩලය හා අභ්‍යාසලාභීන් ස්වයංරැකියා පුහුණුව | පුවක්පිටිය -ජයවිරු සෙවන, සමාධි නිවහන කාර්ය මණ්ඩලය | 2018.12.25 | පුවක්පිටිය - ජයවිරු සමාධි ආයතනය | 8,000.00 |
| මුදල් රෙගුලාසි හා ආයතන සංග්‍රහය පිළිබඳ දෙදින වැඩමුළුව | වෘත්තීය උපදේශක හා නිවාස පාලක නිලධාරීන් 21ක් | 2018.12.26/ 27 | ජාතික ශ්‍රම අධ්‍යන ආයතනය | 126,000.00 |